**<u>වර්ෂ 2022 මැයි 20 වන දින පෙ.ව. 09.00 ට පවත්වන්නට යෙදුනු කුරුවිට ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීමේ වාර්තාව :-</u>**

- **<u>සභාපතිතුමා මුලසුන ගැනිම</u>** :- ගරු සභාපතිතුමා විසින් පැමිණි සිටි සියළු දෙනා පිලිගන්නා ලදී. මහ සභාවේ පෙ.ව. 9.00 වන විට සණ පූර්ණය නොමැති හෙයින් විසින් මහ සභාවේ කටයුතු පෙ.ව. 09.45 දක්වා කල්තැබීමට ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර එය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ආර්.සෝමරත්න මහතා විසින් ස්ථිර කරන ලදී.

පැමිණීම - මෙදින රැස්වීම සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රිතුමන්ලා සහ ගරු මන්ත්‍රිතුමියන්ලා සහභාගි විය.

| අනු.අ තනතුර | පක්ෂය | නම | පැමිණිම |
|---|---|---|---|
| 1. ගරු සභාපති | ශ්‍රී.ල.පො.පෙ | ප්‍රේමරත්න මල්කැකුල මහතා | පෙ.ව. 08.25 |
| 2. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ප්‍රේමා ගම්ලත් මිය | පෙ.ව. 08.30 |
| 3. ගරු ප්‍රාසම | එ.ජා.ප | නයනා ජීවනි අතුකෝරල මිය | පෙ.ව. 08.50 |
| 4. ගරු ප්‍රාසම | එ.ජා.ප. | එච්.එම්.සී.එස්.ධනවර්ධන මහතා | පෙ.ව. 08.50 |
| 5. ගරු ප්‍රාසම | එ.ජා.ප | ඉන්ද්‍රානි වික්‍රමසිංහ | පෙ.ව. 09.00 |
| 6. ගරු ප්‍රාසම | එ.ජා.ප | චන්ද්‍රලතා බණ්ඩාර මිය | පෙ.ව. 09.00 |
| 7. ගරු ප්‍රාසම | ජ.වි.පෙ | ජී.ඒ.ජයසිංහ මහතා | පෙ.ව. 09.05 |
| 8. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ජී.එම්. ජයරත්න මහතා | පෙ.ව. 09.11 |
| 9. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ආර් .සෝමරත්න මහතා | පෙ.ව. 09.18 |
| 10. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ආර්.ඩිලාන් දර්ශන රණසිංහ මහතා | පෙ.ව. 09.24 |
| 11. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | දීප්ති චන්දන මහතා | පෙ.ව. 09.26 |
| 12. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | එම්.ජී.ධනංජය වීරසේකර මහතා | පෙ.ව. 09.29 |
| 13. ගරු ප්‍රාසම | එ.ජා.ප. | ජී.ඊ.ඒ.රනිල් එදිරිසිංහ මහතා | පෙ.ව. 09.30 |
| 14. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | පී.පී.තරංග නිල්මිණි මහතා | පෙ.ව. 09.35 |
| 15. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | කේ.කේ. දයා කස්තුරි මිය | පෙ.ව. 09.40 |
| 16. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | කේ.ඒ.අසංක දිල්ෂාන් මහතා | පෙ.ව. 09.45 |
| 17. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | රුවන් අශෝක පතිරණ මහතා | පෙ.ව. 09.45 |
| 18. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ජී.ඩබ්.ජනක විමලසිරි මහතා | පෙ.ව. 09.46 |
| 19. ගරු ප්‍රාසම | එ.ජා.ප. | එම්.කේ. විජේසිරි මහතා | පෙ.ව. 09.46 |
| 20. ගරු උපසභාපති | ශ්‍රී.ල.පො.පෙ | ඒ.ජේ.අනිල් ලියනගේ මහතා | පෙ.ව. 09.47 |
| 21. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | මංගල කිත්සිරි ඩයස් මහතා | පෙ.ව. 09.47 |
| 22. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | කැළුම් ශ්‍රී ධර්මදාස මහතා | පෙ.ව. 09.48 |
| 23. ගරු ප්‍රාසම | එ.ජ.නි.ස. | එස්.ඩබ්.රන්ජිත් මෙන්ඩිස් මහතා | පෙ.ව. 09.50 |
| 24. ගරුප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | චන්දිම යුරේශ් පතිරණ මයා | පෙ.ව. 10.10 |
| 25. ගරු ප්‍රාසම | ශ්‍රී .ල.පො.පෙ | ජීවන් රණතුංගමහතා | පෙ.ව. 10.15 |
| 26. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | එස්.ඒ.මහින්ද විජේකුමාර මහතා | පෙ.ව. 10.16 |
| 27. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | පී.ඩබ්.එස්.සම්පත් බොතේජු මහතා | පෙ.ව. 10.12 |
| 28. ගරු ප්‍රාසම | ජ.වි.පෙ | එම්.ඩබ්.විකසිත පුෂ්පසූරිය මහතා | පෙ.ව. 10.15 |
| 29. ගරු ප්‍රාසම | එ.ජ.නි.ස. | රොෂාන් දේශප්‍රිය මහතා | පෙ.ව. 10.20 |
| 30. ගරු ප්‍රාසම | එ.ජා.ප. | අයි.කේ.රංජන් ප්‍රදීප් මහතා | පෙ.ව. 10.30 |
| 31. ගරු ප්‍රාසම | එ.ජා.ප. | කේ.එල්.එම්.ඩී.කරඳන මිය | පෙ.ව. 10.50 |
| 32. ගරු ප්‍රාසම | එ.ජා.ප. | බී.ආර්.ඒ.එම්.එස්.සෝමරත්න මිය | පෙ.ව. 10.40 |
| 33. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | එස්.එච්.අසංක එරන්ද මහතා | පෙ.ව. 10.40 |
| 34. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | පී.කේ.ලක්මාල් රුවන් කුමාර මහතා | පෙ.ව. 10.40 |
| 35. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | රවීන් විනෝද් මහතා | පෙ.ව. 10.45 |
| 36. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | මාලනී පීරිස් මිය | පෙ.ව. 10.45 |
| 37. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ඩබ්.එම්.මදූෂාණි වීරසිංහ මිය | පෙ.ව. 10.45 |
| 38. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | බී.ජී.ජීවන් අබේවික්‍රමපාල මහතා | පෙ.ව. 10.46 |
| 39. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ඩී.එම්. ශානක දර්ශන මහතා | පෙ.ව. 10.48 |
| 40. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | එස්.රත්නසිරි මහතා | පෙ.ව. 10.50 |
| 41. ගරු ප්‍රාසම | එ.ජා.ප. | එම්.ඒ.දේවින්ද කුමාර මහතා | පෙ.ව. 10.55 |
| 42. ගරු ප්‍රාසම | එ.ජා.ප | අයි.කේ.කුලරත්න මහතා | පෙ.ව. 11.05 |
| 43. ගරු ප්‍රාසම | එ.ජා.ප. | එච්.ඩබ්. ජයලත් මහතා | පෙ.ව. 11.10 |

## 01-01 සභා වාර්තාව සහා සම්මත කිරීම.-(2022.04.08 )

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා :-**

2022.04.08 වන දින මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කරන ලෙස යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ප්‍රේමා ගම්ලත් මිය :-**

2022.04.08 වන දින මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීමේ යෝජනාව ස්ථිර කරමි.

**1.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී.ආර්. සෝමරත්න මහතා :-**

න්‍යාය පත්‍රයේ පෙ.ව. 9.00ට සභාව පැවැත්වෙන බව සදහන් කලත් හැමදාම මේ සභාව පෙ.ව. 9.30 දක්වා කල් තියනවා. සනපූර්නය නැතිව. ඒ නිසා මේ සභාව පෙ.ව. 9.30 ට ආරම්භ වන ලෙස වේලාව සංශෝධනය කිරිමට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ප්‍රේමා ගම්ලත් මිය :-**

එම යෝජනාව ස්තිර කරමි.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා**

ඉදිරි සභාවේ සිට මේ වේලාව පෙ.ව. 9.30 ට ආරම්භ වන ලෙස සංශෝධනය කරන්න. ඉදිරි සභාවට පෙ.ව. 9.30 ට ම ආරම්භ කලහැකි ලෙස සියළු දෙනා සහභාගීවෙන්න.න්‍යාය පත්‍රයේ පෙ.ව. 9.30 ලෙස යොදන්න.

**2.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී. එම්.කේ.විජේසිරි මහතා :-**

ගියවර සභාවේ සභාවාර්තාවේ 6 පිටුවේ මා විසින් දක්වන ලද අදහස් -මාර්ග සංවර්ධනය පිලිබද ඇති ගැටළු පෙහොරබාව, කනුග්ගල්ල මාර්ග අඩුපාඩු සම්පූර්න කර නිසි ප්‍රමිතියට සංවර්ධනය විය යුතු බව මා අදහස් දැක්වූවා.නමුත් ඒම අදහස් දීප්ති චන්දන මන්ත්‍රීතුමාගේ ප්‍රකාශ ලෙස සටහන් කර ඇත.නිවැරදි කරන්න. එසේම 36 පිටුව ලීලාරත්න මහතාගේ අභාවය වෙනුවෙන් මා විසින් වෙනත් කරුනු යටතේ දක්වන ලද අදහස් -මා සමුපකාර අධ්‍යක්ෂ මන්ඩලයට පත්වන විට එතුමා දෙල්ගමුව නියෝජිතයෙකු ලෙස සිටිබවත් කැපවී සේවය කල එතුමා ගේ අභාවය වෙනුවෙන් කනගාටුව පල කල බවත් සඳහන් කලා. එම අදහස්ද දීප්ති චන්දන මන්ත්‍රීතුමාගේ ප්‍රකාශ ලෙස සඳහන් වී ඇත.මෙය නිවැරදි කරන්න.

**2.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී. මංගල ඩයස් මහතා :-**

**ගියවර සභාවේ ,නාගරික ප්‍රෙද්ශ සඳහා නාගරික සංවර්ධන අධිකාරියෙන් නිකුත් කර ඇති නියෝග රෙගුලාසි නාගරික නොවන ප්‍රෙද්ශ වලටද යොදාගැනිමට යෝජනා කල අවස්ථාවේ අතුරු ව්‍යවස්ථා අනුව කටයුතු කිරමට යෝජනා උනා. ඒ විස්තර මේ සභාවට දානවා කිව්වා .ඒ විස්තර ලබා දෙනවාද?**

**24 පිටුව බල්බ් මිලදිගැනීම මිල ගනන් කැදවීමේදී සාම්පල ඉදිරිපත් කල යුතුයි.ඒවා ඉදිරිපත්කර නෑ.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**වැරදිනම් ඊට අදාල කටයුත්තක් කරන්න.නමුත් මෙය සංශෝධනයක්ද?**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී. ආර්. සෝමරත්න මහතා :-

**මම අදත් විරුද්ධයි.මම එදා කල ප්‍රකාශ සඳහන්. නමුත් එදා මම බෙදිමක් ඉල්ලුවේ නෑ.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනි මිය :-

**මාත් විරුද්ධයි.බෙදිමක් ඉල්ලුවේ නැතත් විරෝධතාවය පල කලා.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා :-

**බෙදිමක් ඉල්ලුවේ නැතත් තමන්ට විරෝධතාවය පල කල හැකියි.**

**28 පිටුව මා විසින් එල්ලාවල පිටකන්ද අතුරු මාර්ගය සංවර්ධනය කිරිම සම්බන්ධ ග්‍රාම සංවර්ධන සමිතියේ ඉල්ලීමේ ලිපියත් අනුව අදහස් දැක්වූවා.ඒ අනුව පිටකන්ද අතුරු මාර්ගය සංවර්ධනය කිරිම ගිවිසුම් මුදල වන රු.700000.00මුදල රටේමුල්‍ය තත්වය අනුව ප්‍රමානවත් නොවන නිසා ගිවිසුම් මුදල තුලම අදාල ඇස්තමේන්තුව සංශෝධනය කර දෙන ලෙස ඉල්ලු අතර එම ඉල්ලිම ග්‍රාම සංවර්ධන සමිතියේ ඉල්ලීම අනුව සිදු කලේ.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී. එම්.කේ.විජේසිරි මහතා :-

**යම් යෝජනාවකට බෙදිමක් ඉල්ලුවත් සුළුතරයක් විරුද්ධ වෙයි.ඒත් මෙවැනි කාරනාවක් සම්බන්ධයෙන් යම් ප්‍රමානයක් විරුද්ධ උනත් පොදු සභා මතය පෙන්විමට නම් ඉදිරියේදිවත් අවශ්‍ය අවස්ථා වල බෙදීමක් ඉල්ලන්න.**

**Xxxxxxxxxxxxx** 2022.04.08 වන දින මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව **ඒකමතිකව මහා සභා සම්මත විය. Xxxxxxxxxxx**

ප්‍රේමරත්න මල්කැකුල,
සභාපති,
ප්‍රාදේශිය සභාව,
කුරුවිට.

**02.**සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන-නැත.

**03.**ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ , පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන.-

(මුදල් අමාත්‍යාංශය මගින් නිකුත් කල රාජ්‍ය වියදම් පාලනය කිරිම පිලිබඳ ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022)

**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා -</u>**

මුදල් අමාත්‍යාංශය මගින් නිකුත් කල රාජ්‍ය වියදම් පාලනය කිරිම පිලිබඳ ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 සහගත කරමි. එසේම මෙහි පිටපත් සියළු ගරු මන්ත්‍රීතුමන්ලා තුමියන්ලා වෙත ලබාදෙන්න.

**<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා</u>**

මෙය වැදගත්.මුදල් අමාත්‍යාංශය මගින් ලබා දීඇති මෙම චක්‍ර ලේඛනයට පිටින් වැඩ කරන්න බැ.අපේ රාමුව මෙයයි.ඒ අනුව කටයුතු කරමු. නැතහොත් අධිභාර පවා විමට හැකියි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී. එම්.කේ.විජේසිරි මහතා :-</u>**

එකඟයි. ඒ අනුව කටයුතු කරමු.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී. ආර්. සෝමරත්න මහතා :-</u>**

මෙම කරුණ සම්බන්ධව ලේකම් තුමිය වගකීමෙන් කටයුතු කරන්න.ගරු සභාපතිතුමා ඒ දැනුවත්කිරිම අනුව කටයුතු කරන්න.

**04.** යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත

**<u>05.යථා පරිදි කල්දී ඇති යෝජනා :-</u>**

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා

**05-01.**අප බල ප්‍රදේශයේ විශේෂයෙන් එල්ලාවල හා පහලගම ග්‍රාම නිලධාරි වසම්වල ග්‍රාමීය නිෂ්පාදන ක්‍රියාවලිය ,එහි වසම්වල ග්‍රාම සංවර්ධන සමිති පදනම් කරගෙන නිශ්පාදන ක්‍රියාවලියක් ආරම්භ කිරීමේ යෝජනාව.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා

අප බල ප්‍රදේශයේ විශේෂයෙන් එල්ලාවල හා පහලගම ග්‍රාම නිලධාරි වසම්වල ග්‍රාමීය නිෂ්පාදන ක්‍රියාවලිය ,එහි වසම්වල ග්‍රාම සංවර්ධන සමිති පදනම් කරගෙන නිශ්පාදන ක්‍රියාවලියක් ආරම්භ කිරීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී.රුවන් අශෝක මහතා :-
එම යෝජනාව ස්ථිර කරමි.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා
අපේ ප්‍රෙද්ශයේ අපි යම් ග්‍රාමීය නිෂ්පාදන ක්‍රියාවලියක් වැඩිදියුණුකර පවත්වාගෙන යා යුතුයි. කෘසි කටයුතු ගොවිපල කටයුතු ආදියට අපිට මැදිහත් වෙන්න පුළුවන්. මුදල් නොවේ.අපිට මේවාට පද්ධතියක් සකසන්න පුළුවන්.

අපේ ගම්වල විවිධ කන්ඩායම් එකතු වෙලා ස්වයං රැකියා ව්‍යාපෘති සඳහා ක්‍රියාවලී ආරම්භ කලා. වත්තේ හේන කුරුඳු තෙල් නිෂ්පාදනය , ආදිය.මේ කටයුතු ආයතන අතර සම්බන්ධීකරනය කරලා දෙන්න පුළුවන්. මම මේ වන විටත් යම් දායකත්වයක් දෙනවා. ගරු ආන්ඩුකාරතුමාට විතරක් නෙවෙයි ග්‍රාම සංවර්ධන අමාත්‍යංශ, කෘෂි අමාත්‍යාංශය ,මේ සියල්ලට දැනුම්දී අත්‍යවශ්‍ය කටයුත්තක් සේ සලකා අවශ්‍ය මග පෙන්වීම ලබා දෙන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනී මිය :-

ස්තිරයි. ඇත්තටම කාලෝචිතයි.මීට පෙරත් ස්වයංරැකියා කරන පිරිස සම්බන්ධව කටයුතු කිරිමට යෝජනා කලත් ප්‍රතිපාදන නෑ.මෙතුමා කීවා වගේ ජනාධිපති ලේකම් කාර්යාලය වගා සංග්‍රාමය යටතේ බිම්මල්, ඔකිඩ් සම්බන්ධව ගම්වල කණ්ඩායම් හදලා .ආදායම් ලබන විධිහට හදන්න පුළුවන්. අපි ව්‍යාපෘති හදල කොට්ඨාශයෙන් අරින්න ඕනි.ආධාර අරන් කල හැකියි.ජනාධිපති ලේකම් කාර්යාලයේ අදාල අංශයට යොමු කලාම ව්‍යාපෘතිය මුදල් දෙයි.ඉල්ලීම සමග අරින්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී.එම්.කේ.විජේසිරි මහතා :-

ග්‍රාමීය කෘෂි දියුනුව වෙනුවෙන් කටයුතු කිරීම ඉතා වැදගත්.නමුත් ඵලදායී විය යුතුයි.ගම්මිරිස් දෙනවා.හිටවන විධිහ,ඉදිරිය ප්‍රගතියක් නෑ.අවසානයේ කැලෑ වැදෙනවා.මේක වැදගත්. මෙතුමාගේ විතරක් නෙවේ.සියළු ප්‍රදේශවලට වැදගත්. ලොකු ආහාර හිඟයක් එනවා.මෙය ප්‍රමුඛතා කොට ක්‍රියාත්මක කරන්න.කුරුඳු පැල ගම්මිරිස් පැල 5 ගානේ හිටවලා රැකගත්තත් වැදගත්.අත්‍යාවශයයි මෙයට මැදිහත් වෙමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී.ආර්.සෝමරත්න මහතා :-

කාලෝචිතයි.අපේ රටම දැන් ආර්ථික අර්බුධයක.අඳුරු අනාගතයක්.ප්‍රායෝගිකව ආහාර මිල දිනෙන් දින ඉහල යනවා. රටේ රජය මිල පාලනයක් කරන්නෑ.පරිප්පු මිරිස් සියල්ල ගනන්.කුරුවිට විවෘත කලා කුළුබඩු අලෙවි සැලක්.නමුත් ප්‍රමිතියක් තියෙනවා.සංස්ථා මිල හොදයි.අවස්ථාවේ හැටියට මෙය වැදගත්.ආහාර අර්බුධය මුළු ලෝකෙටම බලපාන එකක්. පාන්ගෙඩිය රු.170.00 ක්.යථාර්තය ඒක.අපි ප්‍රාදේශිය දේශපාලන ආයතනයක් ලෙස මේවාට හැකි පිලියම් යොදන්න ඕනි. අපි අර චක්‍ර ලේඛනය අන්ව කටයුතු කරමු.අත්සන් කරලා තියේනම් ව්‍යාපෘති ඒවා අත්හිටුවන්න.හෙට මේ ආයතන විසිරවීම කලත් අපි ප්‍රජාව වෙනුවෙන් වැඩ කල යුතුයි.සංවර්ධන වැඩ කල නොහැකි ලෙස මූල්‍ය අර්බුධයක තිබුනත් කුරුවිට ප්‍රාදේශීය සභාව සම්පත් බහුලයි.කසල දමන ඉඩම අක්කර 10 අක්කර 9ක්ම කැලේ.අද ගම්මිරිස් කිලෝ 1ක් රු.2000.00ක්.මන්ත්‍රීතුමන්ලත් එක්ක කන්ඩායමක් විධිහට සැකසිලා ඒ කැලය අස්වද්දන්න පුළුවන්.ගම්මිරිස් හිටවන්න පුළුවන්.ආදායම් එයි.සුදු ගම්මිරිස් යවන්න හැකිනම් තවත් ආදායම් වැඩියි.තහංචි නෑ.චක්‍රලේඛන බාධා නෑ.යම් මුදලක් යොදවලා පැල ගෙනත් හිටවිය හැකියි. කාලීන අරගලයක් කරන්න වෙලා.බඩගින්නෙ ඉන්න ජනතාවට උත්තර අවශ්‍යයි.ඩොලර් 1ක් දැන් රටට ගේන්න පුළුවන්නම් එය වැදගත්.මේ එක උදාහරනයක් විතරයි.වෙනත් සුළු අපනයන භෝග වවන්නත් හැකියි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි දයා කස්තුරි මිය :-

එකඟයි.සෝමරත්න මන්ත්‍රී තුමා කීවා වගේ මේ හිඟවලට පිලියම වැවීම.ගෙවතු වගා වැදගත්.45 එකතු වෙලා ගෙවතු වගා පිලිබඳ දැනුවත් කරමු. දන්ඩක් විසි කලත් පැලවෙන රට ස්වයංපෝෂී කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී.කැළුම් ධර්මදාස මහතා :-

එකඟයි.විශේෂයෙන් අපි බිම්මල් වගා කරනවා. මේ වෙන කොට ඒ වගේ අමුද්‍රව්‍ය පොලිතීන් විශාල මුදලකට ගන්නේ.ඒවා මිල ඉහල ගිහින්.අසුරන ලිකුඩුත් එහෙමයි.මේ ව්‍යාපෘතියට අත්වැලක් වෙන්න පුළුවන් නම් වැදගත්.කෘෂි අමාත්‍යාංශය ,සමූපකාර දෙපාර්තමේන්තුව ට කතා

කරලා මේ වාට සහන් අරන් දෙන්න.සහන මිලකට ලබාදෙන්න.ගිය වකවානුවේ උප සභාපතිතුමා කීවා වගේ විශාල පැල වර්ග ලබාදුන්නා. කුරුඳු ගම්මිරිස් පැල සංවර්ධන නිලදාරීන් ග්‍රාම සේවා නිලධාරි හරහා දුන්න. ඒවා හිටෙව්වා නම් රු.2000.00 ආදායම් ලබනවා.කරුංකා රු.1000 ට වැඩියි.මේ ආහාර හිඟය එක්ක මේවායේ ප්‍රගතිය බැලීම වැදගත්.නිලධාරීන් 5ක් විතර ඉන්නවා බලන්න.නමුත් මේවා හරියාකාර කෙරෙනවාද නිරික්ෂනය අඩුයි.අපේ පැත්තේ නිලධාරීන් බලනවා.ගොඩක් පැතිවල බලන්නේ නෑ.කියාදෙන්නෑවිශාල පැල ප්‍රමානයක් අපතේ.පැල ලක්ෂෙන් 50000 ක්වත් තියෙන්න ඕනි.එලක් නැතිවෙලා.අපිට අධීක්ෂනය ක් වත් නෑ.කලමනාකරනය නෑ.මේ සභාත් විසුරවනවානම් මේ දෙන මුදලත් රජයට ගත හැකියි.මේ තත්වය මත පලක් නෑ.මේ යෝජනා වලය කාලයක්නෑ.කෘෂි, ගොවිජන සේවා මධ්‍යස්ථාන දැනුවත් කරලා ප්‍රගතිය දැන්වත් බලන්න කියමු.පොල් පුවක් ගම්මිරිස් කරාබුනැටි වගේ පැල වැදගත්.මේවා අමතර ආදායම්.අදාලආයතන දැනුවත් කරන්න.ගරු ජානක ඇමතිතුමා දුන්න පැල හිටෙව්වද කියලා පරික්ෂා කරලා ප්‍රගතිය සොයා බලන ලෙස දැනුම් දෙන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී.ඩිලාන් දර්ශන මහතා :-</u>

අපිට අයිතියක් තියෙනවා ප්‍රජාවගේ සුබ විහරනය උදෙසා කටයුතු කිරීමට.පනත අනුව යමක් කල හැකියි. සභාවට අපි අළුතෙන් ආවාම එහෙම කතා ආවා.නමුත් බුජෙ සෙට් තනකොල කපන යන්ත්‍ර අපි බෙදුවා.ඒවා හරි විධිහට කරන්න ඕනි.ඉදිරි වසර 25 තුල විශාල ආහාර අර්බුධ එනවළු. නමුත් අපි මේ ක්‍රමයත් එක්ක වෙනස්වුනා.මගේ කොට්ඨාසේ අක්කර 159 කුඹුරු කලා. දේශපාලන මොන මතිමතාන්තර තිබුනත් කුඹුරු සඳහා පාඩුවක් නෑ.නාමල්දෙනිය කුඹුරු අක්කර 10ක් මම වවන්නේ.අදටත් කෘෂි ප්‍රශ්න පිලිබඳව මට කතා කරන්නේ.අපිට කල හැකිදේ නියම වගකීමෙන් යුතුව මැදිහත්වීම් දීලා මම කරනවා.අපිට බැ කියන එක නෙවේ.වැදගත්.සම්පත් තියෙනවා. ආකල්පයි හදාගන්න ඕනි.ප්‍රජා ආකල්ප හදන්න ඕනි.මම කියනවා.රු. ලක්ෂෙන් අඩි 100 ක් මාර්ගය කොන්ක්‍රිට් කලා. අපි ප්‍රාෙද්ශිය ලේකම් මගින් අනුමැතිය අරන් වැලි සපයාගෙන අඩි 125 ක් හැදුවා.ප්‍රමිතියට. හත්දෙනෙක් ශ්‍රමය දුන්නා .මගේ සාක්කුව පිරුනේ නෑ. නමුත් මම ක්‍රමය වෙනස් කරලා ප්‍රමිතිටයට ජනතා අවශ්‍යතාවය උපරිමයෙන් ඉටු කලා.අපි පුවක් හිටෙව්වා.ගොවි ජනතාවට. තවත් පැල 1500 ක් හිටවනවා මිල්ලවිටියේ.සියල්ල අධීක්ෂනය කරනවා.ගමේ ගෙවල්වල දුම්ගෙවල් තියෙනවා.ගහෙන් වැටෙන් කොස් ටිකෙන් අපිට පුළුවන් විශාල ආදායමක් ලබන්න. මම අද උදෙත් රු.2500.00ක මැ දමලා ආවේ කඩේට.මම හිටවපුවා.ඒක ගම මැද්දෙන් අරන් යන්නේ ආදර්ශයක් වෙන්න.කෙනෙක් හරි හැදුනොත් .ඒ නිසා වගා විප්ලවයට අපි එකතුවෙන්න ඕනි.අරගලය මොක උනත් තම වගකිම් ඉටු කරන්න ඕනි.යැපුම් බෝග,වාණිජ භෝග,තියෙනවා. හාල් 45%ක් ගමේ හදන්න පුළුවන්.මිල්ලවිටිය ව්‍යාපෘතිය ලීවා.අපි ඒවා සාර්ථක නිමාවක ඉන්නවා.අපේ සභා වාර්තාවල ධනාත්මක දේ කියලා තියෙනවා. ඒත් ඒවා ක්‍රියාත්මක නෑ.අපිට ලංකාවම පාලනය කරන්න බෑ.නමුත් අපි 45 එකතු වෙලා මේ බල ප්‍රදේශය දියුණු කරමු.ගැටළු වලට මුහුන දෙමු. කුරුඳුවලට වඩා දේ වවන්න පුළුවන් මේ රටේ.විශේෂ පුහුනු වක් දීලා කොටසක් හදමු.මෙහෙයවීමට.හතු වගාව නවතම විධිහෙන් පර්චස් 6න් විශාල ආදායමක් ලබන්න පුළුවන්.මාලු මිරිස් වගාවත් එහෙමයි.සම්පත් තියෙනවාත අපි ඒවා නිසි පරිදි කලමනාකරනය කල යුතුයි.විවිද වැරදි වලට හේතු සොයනවට වඩා අපි අවශ්‍ය ශක්තීන් ගෙන සිදු කරන්න අපි

දැනගන්න ඕනි.නීතිය අපි දැනගෙන ක්‍රමය හදලා අපි ක්‍රියාත්මක කරමු. මට සැලසුමක් තිබුනා මගේ කොට්ඨාශයට මල ගෙදරකට රු.20000.00ක ඉතිරියක් කරලා දෙන්න.මම බුපේ සෙට් එක,ලිප,හට් පුටු පිඟන් පවා දුන්නා.ගමේ සමිතියට. දැන් මුදල් නොදුන්නට ඒ වැයවන මුදල ඉතිරිවෙනවා. මල ගෙදරට.මම ඒ දේ කලා.මම දැකපු දේශපාලඥයායි ඒ.අපේ ගම අපි හදන්න ඕනි.කල හැකි දේ කරමු.මීට පෙර සභාවේ යෝජනා උනා නගරයේ අලෙවි මධ්‍යස්ථානයක් හදන්න.ඒකත් එක්ක මේ යෝජනාවටත් ප්‍රමුඛතාවය දෙන්න.වවමු කිව්ට බෑ.මේ වගා ඉවර වෙන වෙලාව.කන්න පිලිබඳ දැනුම අවශ්‍යායි.ජූලි මැද පුළුවන් වවන්න.සියළු භෝග වලට වගා කාල රාමුවක් තියෙනවා.මුල් හඳ,උදේ,හවස, හිටවන විවිධ ක්‍රම හා ආවේනික තත්ව තියෙනවා. ගෙවතු වගාවන්ට ඇට නැති පේරත් වැදගත්. අපේ කිරි නිෂ්පාදනය 14% යි. නමුත් අපේ රටේ තනකොල කොපමන අපතේ යනවාද?තනකොල වවලා දේන්න ගියොත් විශාල මුදලක් වැය වෙනවා.අපේම කොපමන තනකොල කපලා අපතේ දානවද?ආදර්ශ ඕනි.මේවාට ක්‍රම ඕනි.කමිටු හදලා සාකච්ඡා කරන්න. සංවර්ධනය ඉලක්කගත වැඩ පිලිවෙලවල් ඕනි.ඇත්තටම දඹුල්ලේ බන්ඩක්කා මැ බටු ගේන්න ඕනිද? තෙල් නෑ.ඉතා මිල ගනන් ඉහලයි.අපේ ප්‍රෙද්ශයේ මේ සියල්ල වැවෙනවා.ඒ නිසා හැම බිම් අඟලම වවමු.ඊට මූලික පියවර මේ සභාවෙන් අරන් මැදිහත්වෙමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී</u>.මංගල ඩයස් මහතා :-

මේ කටයුතු පිලිබඳ පුහුණුවක් දීලා ඵලදියී ලෙස කල හැකියි.කෘෂි ආදර්ශ සැකසිය හැකියි.වලඳුර වෙල්යාය අප් අස්වැද්දුවා.අක්කර 16 කුඹුරු පුරන්වෙලා තිබුනේ.වෙනත් මුදලකින් අපි වේලි ගොඩ දැම්මා.ගැටළුව කුරුවිට සිට යන ඇලපාර.ජලය බහින්නෑ.වලඳුර වෙල්යාය යටවෙනවා.වපුරන්න තියෙන්නේ.සභාවට යෝජනා දාලා. කඩිනමින් මේ ඇල සකසන්න.
එසේම මේ කාලයේ ආහාර අර්බුධයක් එන්නේ.පසුගිය කාලේ යම් යම් භෝග දුන්නත් ඒවා හැමතැනම හිටවලානෑ. ඒවා නිසි ලෙස අධික්ෂනය වෙලා නෑ.පරගල තැන්නේ අය ඇට පැකට් එකක් ගන්න වලඳුර පන්සලට එන්න ඕනි. මේවා ප්‍රායෝගික නෑ.අපේ පනත අනුව අපිට මුදල් යොදවන්න පුළුවන්.හැම කොට්ටාශෙකටම එක ගානේ ව්‍යාපෘති හැදුවොත් අපිට පුළුවන් පලදායි ලෙස මේ ගැටළුව විසදන්න.ඩිලාන් මන්ත්‍රිතුමාට දැනුම තියෙනවා.ඒක අපි ඵලදායිලෙස ප්‍රයෝජනයට ගමු. බිම්මල් වලට බොයිලේරු ටිකක්දිලා.ටිකකට නෑ.ග්‍රීන් හවුස් ක්‍රමයටත් හදන්න පුළුවන්.අපි සමුපකාර සමිතියට කතා කරමු.සභාවක් ලෙස ගොඩනැගෙමු.භෝග විවිධාංගීකරනයක් අවශ්‍යයි.බටු මිරිස් පොල් පැල කිපයක් එක පවුලකට ඇති.බීජ හරි ඒවා දෙන්න ඕනි. බන්ඩක්කා ඇත්දල එක හරි.දින 60න් පලදාව එනවා.අපි කමිටු පිහිටුවල මේ කටයුතු අරඹමු.
වලඳුර වෙල්යායේ වතුර බස්සලා දෙන්න. ඒ කටයුතු කඩිනම් කරන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී</u>.රංජිත් මෙන්ඩිස් මහතා :-
ඉතා වැදගත් යෝජනාවක්.මේ වන විට හැම ගෙදරම වගේ පර්.10 විතර තියෙනවා.රජයෙන් පැල දුන්නා.ඇතැම් පැල තාම ගේ පිටුපස. ප්‍රගතියක් නෑ.අධීක්ෂනයක් නෑ.පැනිවරකා දුන්නා

ඇතැම් අය හිටවලා නෑ.ඉඩමක් තියේද බලලයි දෙන්න ඕනි.පලතුරුත් පැල හිටවලා නෑ.ක්‍රමවේද අවශ්‍යයි.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා</u>

මට සතුටුයි. අළුත් අදහස් දුන්නා.මාත් ඉගෙන ගත්තා. කොට්ටාසෙට එක ව්‍යාපෘතිය බැගින් නියාමන ව්‍යාපාති කලොත් මේ ආහාර අර්බුදයට පිලියම් ගන්න පුළුවන්.අපේ කොම්පෝස්ට් ව්‍යාපෘතියට සමගාමීව ක්‍රියාත්මක කල යුතුයි.මේ කටයුත්ත ක්‍රියාවට නංවමු.කුරුවිට ප්‍රාෙද්ශිය සබාවෙන් නිර්මානය කරලා මෙකට පසුබිම හදමු.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා -</u>

මේ යෝජනාව කාලෝචිතයි.ගොඩක් අදහස් දැක්වුවා.
ඉහතදි රජයෙන් ලබාදුන් සියළු පැල වගා කරලා නැළු.ජන ජීවිත නගා සිටුවන්න වගා වලට පැල දුන්නට ගත්ත කෙනා හිටවන්න ඕනි.ඒක තමාගේ වලකිම.ජනතා නියෝජීතයන් ලෙස මේ රට පෙරට ගන්න අපි සහාය වෙන්න ඕනි. අපි දැනුවත් කරවීම වැදගත්. නයනා මන්ත්‍රි තුමිය කීව ලෙස ව්‍යාපාති ලබා දිම වැදගත්.රජය දුන්නට ඒවා ගමට ගන්න ක්‍රමවේද ජනතාව දන්නේ නෑ. සියළු දෙනාගේ අදහස උනේ කමිටුවක් පත් කරලා මේ කටයුතු ඉදිරියට ගෙනයාම.ඒනිසා කමිටුවක් පත්කරමු.සෝමරත්න මන්ත්‍රි තුමා කිව ලෙස පොහොරබාව දැන් අක්කර 10 උනාට ඒකෙන් 5ක් විතර කසල බැහැර කරලා.දැන් පටන් ගත්තා කටයුතු.නොගිය අයත් ඇති.ගිහින් බලල දායකත්වය දෙන්න.අඩුපාඩු බලාගත හැකියි. දිනයක් දාගෙන යමු.ඒ භුමියේ කැමති අය ඉන්නවා නම් වගා කරන්න සොයා බලල අපි නීත්‍යානුකූලව දෙමු. වගා කරන්න. නමුත් අයිතියක් කියන්නබෑ.සොයා බලා කරමු.කමිටුවෙන් මේ පිලිබඳ වැඩපිලිවෙලක් කරමු.

ප.ව. 11.00ට පමන ගරු නයනා ජීවනී මන්ත්‍රිතුමිය සහ ගරු චන්ද්‍රලතා බණ්ඩාර මන්ත්‍රිතුමිය සභාව දැනුවත්කර අත්‍යවශ්‍ය කටයුත්තක් සදහා සභා ගැබෙන් නික්මිනි.

පැල හෝ බීජ ගත්තාම ඒවා සිටවනවාද කියලා කෘෂි නිලධාරින් මගින් අධීක්ෂනය කරමු. කෘෂි පර්යේෂන නිලධාරින් මගින්.අද සභාවේ ගත්ත තීරනයක් ලෙස මේ යෝජනාවට සියළු නිලධාරින්ගේ සහාය ලබාදෙන්න ඉල්ලමු.තව මාස 6ක් පමන කාලයක් අපිට තිබුනත් මේ චක්‍ර ලේඛනය අනුව කිසිවක් කරන්න බෑ. නමුත් මේ කටයුතු සඳහා යම් කැපවීමක් අපිට කරන්න පුළුවන්. ඩිලාන් මන්ත්‍රිතුමා වටිනා අදහස් දැක්වුවා.ජනතාවට විශාල පහසුකම් ලබාදීලා. මල ගෙයක් උනාම ඒ කරන සත්කාරය ඉතා වටිනවා.ආදර්ශයක්.පක්ස පාට නැතිව ඒ වගේ අවශ්‍යතා හඳුනාගෙන ස්වේඡචා සංවිධානවලට ඉල්ලිම් කරන්න කියමු.හොඳ යෝජනාවක්.විශාල සේවයක් කලහැකියි.අපි කමිටුවක් හදල උප සභාපතිතුමගේ යෝජනාව ක්‍රියාවට නගමු.දයා කස්තුරි මිය කිව ලෙස ගෙවතු වගාව මේ අවස්ථාවේ ඉතා වැදගත්.ඩිලාන් මන්ත්‍රිතුමා කීව ලෙස අපිට ජනතාවට මෙහෙයුමක් උපදෙස් ලබාදිය හැකි පිරිසක් මේ සභාවේ සිටිනවා.සියළු දෙනාට උවමනාවක් තියෙනවා මේ අදහස් ක්‍රියාවට නංවන්න. මෙන්ඩිස් මන්ත්‍රිතුමා කිව ලෙස සමහර පිරිස් රජයෙන් දුන් පැල හිටවලා නෑ.මේ ජනතා ආකල්පයයි මුලින්ම වෙනස් කල යුත්තේ.අපි කල හැකිදේ කරමු.අපි මේ කමිටුව හරහා සියළු දේ කිරිමට

සැලසුම් කරමු.අපි සභා භූමියත් ආදර්ශයක් ලෙස සකසමු.එසේම මේ සඳහා මෙහෙයුම් කමිටුවක් පත්කරගමු. ඒ අනුව ගරු උපසභාපතිතුමාගේ යෝජනාව අනුව

අප බල ප්‍රදේශයේ විශේෂයෙන් එල්ලාවල හා පහලගම ග්‍රාම නිලධාරි වසම්වල ග්‍රාමීය නිෂ්පාදන ක්‍රියාවලිය ,එහි වසම්වල ග්‍රාම සංවර්ධන සමිති පදනම් කරගෙන නිශ්පාදන ක්‍රියාවලියක් ආරම්භ කිරීමේ යෝජනාව හා ඊට සමගාමීව බල ප්‍රදේශයේ ජනතාවගේ ජන ජීවිතය නංවා සිටුවීමට වගා කටයුතු හා නිෂ්පාදන කටයුතු අවශ්‍ය සියළු අංශ සමග සම්බන්ධීකරනය හා උපදෙස් ලබාදීම ඇතුළු කටයුතු සඳහා පත්කිරිමටත් ඒ ක්‍රියාකාරි කමිටුවට කමිටුවට පහත සාමාජිකයන් පත් කිරිමටත් යෝජනා කරමි.මාද ඇතුළුව

1. ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා
2._ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ඩිලාන් දර්ශන රණසිංහ මහතා(කැඳවුම්කරු)
3._ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි මංගල ඩයස් මහතා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ජී.එම්.ජයරත්න මහතා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි තරංග ආනන්ද මහතා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී දයා කස්තුරි මිය.
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ජනක විමලසිරි මහතා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි එම්කේ. විජේසිරි මහතා
9.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනී අතුකෝරල මිය
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි රංජිත් මෙන්ඩිස් මහතා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ජීවන් රණතුංග මහතා
12.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි විකසිත පුෂ්පසූරිය මහතා
13.ලේකම්- කුරුවිට ප්‍රාදේශිය සභාව-එස්.එච්.ආර්.වීරක්කොඩි මිය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ප්‍රේමා ගම්ලත් මිය.

යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ශ්‍රීමතී සෝමරත්න මිය.
තොරතුරු වට්ස්ඇප් කරන්න.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි එම්.කේ.විජේසිරි මහතා
ලිපිගොනු වලට නෙවේ .මේවා ක්‍රියාත්මක කරන්න.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා
බහුකාර්ය නිලධාරීන්ගේ සහායත් ගන්න පුළුවන්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ඩිලාන් දර්ශන රණසිංහ මහතා
ඕනෑම තාක්ෂනයක් ඔස්සේ අපි මේ කටයුතු සිදු කරමු.ප්‍රායෝගිකව උපරිම තත්වයට ගමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි තරංග ආනන්ද මහතා
මහ පොලවේ පය ගසා මේ කටයුත්ත සිදු කරමු.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx_ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා ගේ යෝජනාව අනුව අප බල ප්‍රදේශයේ විශේෂයෙන් එල්ලාවල හා පහලගම ග්‍රාම නිලධාරි වසම්වල ග්‍රාමීය නිෂ්පාදන ක්‍රියාවලිය ,එහි වසම්වල ග්‍රාම සංවර්ධන සමිති පදනම් කරගෙන නිශ්පාදන ක්‍රියාවලියක් ආරම්භ කිරීමේ යෝජනාව හා ඊට සමගාමීව බල ප්‍රදේශයේ ජනතාවගේ ජන ජීවිතය නංවා සිටුවීමට වගා කටයුතු හා නිෂ්පාදන කටයුතු අවශ්‍ය සියළු අංශ සමග සම්බන්ධීකරනය හා උපදෙස් ලබාදීම ඇතුළු කටයුතු සඳහා** ක්‍රියාකාරි කමිටුවට ක් **පත්කිරිමටත් ඒ** ක්‍රියාකාරි **කමිටුවට ඉහත සාමාජිකයන් පත් කිරිමටත් කමිටුව රැස්වී ඉදිරි කටයුතු කඩිනමින් සිදු කිරිමටත් ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

## 2020.05.20 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක 05-02 හි උද්‍ෘතය

**05-02.** පවතින තත්ත්වය තුල සභාව සතු අරමුදල් හා සම්පත් උපරිම ඵලදායීලෙස හා බහුතර ජනතාවට ප්‍රයෝජනවත් වන ලෙස සකසුරුවමින් යෙදවීමට කටයුතු කිරීමේ යෝජනාව.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා</u>
පවතින තත්ත්වය තුල සභාව සතු අරමුදල් හා සම්පත් උපරිම ඵලදායීලෙස හා බහුතර ජනතාවට ප්‍රයෝජනවත් වන ලෙස සකසුරුවමින් යෙදවීමට කටයුතු කිරිමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා</u>

මම උදාහරනයක් කියන්නම්.පිටකන්ද ග්‍රාම සංවර්දන සමිති ශාලාව හැදුවා.නමුත් දින 30න් එක් දිනක් ඇරලා පලක් තියේද?ලක්ෂ 6ක් වියදම් කරලා.පලක් නැති කටයුතු අධීක්ෂනය කරන්න ඕනි.හුදෙක් යෝජනා ක්‍රියාත්මක කිරිම පමනක් පලක්නෑ.මේවා අධික්ෂනය කරන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තරංග ආනන්ද මහතා</u>

වැඩිම ප්‍රජා ශාලා තියෙන්නේ තලාවිටියේ .කීයක් පල සහිතද?ගම් පුස්තකාලයක් හැදුවා.ඒ වහලත් කැඩිලා.පොත් දිරලා.යතුරත්නෑ.මේවා අපතේ.උපරිම පල ලැබෙන කයුතුයි කල යුත්තේ.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා</u>

අපි අර්බුධයට මුහුනදීලා. මුදල් දෙන අය නෑ. සභා කාර්ය කරන්න ඕනි.සභා පනතේ වගකීම් තියෙනවා.කසල අනිවාර්යෙන් රැස් කරන්න ඕනි.සේවක යාන්ත්‍රනය ඕනි.ප්‍රාග්ධනය ඕනි.

අය කිරිම් තියෙනවා.අයකිරිම් කපා හරින්න එපා.මේ ක්ෂේත්‍රෙය් දැනුම තියෙන අය ඉන්නවා. ඩිලාන් මන්ත්‍රිතුමා විකසිත මන්ත්‍රිතුමා නයනා මන්ත්‍රිතුමිය ,විවිධ අංශ වලදැනුම.රුවන් මන්ත්‍රිතුමා ජනතාවට සහන සැලසීම පිලිබද දන්නවා.මංගල මන්ත්‍රතුමා ජලය ව්‍යාපෘති සම්බන්ධ ප්‍රවීනයෙක්.සංකලනය කරලා යහපත් හරවත් දේ සමාජයට කරන්න පුළුවන්.අපි හිතුමතයට වැඩ කලොත් සේවක පඩි සෞඛ්‍ය කම්කරු පඩි ගෙවන්න බැරිඋනොත් මොකද කරන්නේ.

ස්ථාවර මුදල ආරක්ෂා කරන්න.ජනතා වරම යහපත් ලෙස භාවිතා කරන්න.ජනතාවට කල හැකි සංවර්ධනයක් ලබාදෙමු.ගෙදරක් වගේ තමා .සියල්ල අරපිරිමැස්මෙන් කල යුතුයි.කාර්යාල

**වලත් ඒ.සි අවශ්‍ය නෑ.අපි එකම පන්තියේ.ලේකම් තුමිය මේවා බලන්න. අතීතයේ අපිට මේ ගැටළු තිබුනේ  නෑ.නමුත් දැන් ගැටළු.අපි එක්ව මේ අර්බුධයෙන් ගොඩ එමු.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්කේ.විජේසිරි මහතා</u>

**යෝජනාවෙන් මතු කල සියළු කරුණු අගය කරනවා.එසේම පසුගිය වකවානුවේ සිදුවු සියළු ගැටළු සම්බන්ධව කනගාටුයි.උපසභාපතිතුමා කී අයුරින් අපි සියල්ල උපරිම පලදායි වනලෙස අරපිරිමැස්මෙන් සිදුකල යුතුයි.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx_ගරු උප සභාපති  අනිල් ලියනගේ මහතා ගේ යෝජනාව අනුව _පවතින තත්ත්වය තුල සභාව සතු අරමුදල් හා සම්පත් උපරිම ඵලදායීලෙස  හා බහුතර ජනතාවට ප්‍රයෝජනවත් වන ලෙස සකසුරුවමින් යෙදවීමට කටයුතු කිරිමට  ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**2020.05.20 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක 05-02 හි සත්‍ය උදෘතයක් බවට සහතික කරමි.**

**එස්.එච්.ආර්.වීරක්කොඩි,**
**ලේකම්,**
**ප්‍රාදේශීය සභාව,**
**කුරුවිට.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ජීවන් රණතුංග මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව.

**05-03.** ජල සම්බන්ධතා ලබාදීමේදී මාර්ගය පළුදු කිරීම සඳහා ප්‍රාදේශිය සභාව මගින් ලබාගන්නා ඇපමුදල නැවත ලබාදීමේදි ඇතිවන ගැටළු නිරාකරනය කිරීම සම්බන්ධ යෝජනාව.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ජීවන් රණතුංග මහතා

ජල සම්බන්ධතා ලබාදීමේදී මාර්ගය පළුදු කිරීම සඳහා ප්‍රාදේශිය සභාව මගින් ලබාගන්නා ඇපමුදල නැවත ලබාදීමේදි ඇතිවන ගැටළු නිරාකරනය කිරීම කඩිනම් කිරිමට යෝජනා කරමි.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා -

මේ සම්බන්ධයෙන් තවත් ගැටළු පවතීනම් ඒවා කඩිනමින් විසඳන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා

මාර්ගවල පළුදු කිරිම් ගැටළු තියෙනවා. නඩුකාරදෙනිය ජල සම්පාදනයෙන් ජලය දෙන්න යනවා.කුඩා නගර එකෙන් ජලය ලබාගත් අයට ත් සම්පූර්න මුදල ගෙවන්න කියලා.
ජල සම්පත් මන්ඩලයට දිගටම කීවා.ඒ සබඳතා තියෙනඅයට හිලව් කරන්න කියලා තීරනය කලා.මමත් අරන් තියෙනවා.මේ සම්බන්ධයෙන් කටයුතු කරන්න.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා -

මේ යෝජනාව අපි කමිටුවක් ලෙස ගිහින් සාකච්ජා කලා.සබරගමු පලාත් සභාවෙන් ආවා.ජල සම්පත් මන්ඩලයෙන් ආවා.තිරනයක් ගත්තා කුඩා නගර එකෙන් ජලය ගත් අයගෙන් මුදල්

**නෙගන්නා බවට.නැවත ලිපියකින් දැනුම්දෙමු. සාකච්ඡාවක් කරන්නත් ජලසම්පාදන මන්ඩලයෙන් දිනයක් ගමු.එදිනට එන්න.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා</u>**

**අතුරු ප්‍රශනයක්. මේ සංවර්ධන යෝජනා වලට දැන් මුදල් යොදවන්න බැනේ.එමනිසාත් මුදල් දැනට නැති නිසාත් අවසර ආවාම කරමු.**

**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා -</u>**

**දැනට මුදල් නෑ.මුදල් ලැබෙන්න තියෙනවා.ලැබුනුපසු කල ඒවාට ගෙවන්න වෙනවා.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දීප්ති චන්දන මහතා</u>**

**ලක්ෂ 10 ක ව්‍යාපෘති.පාර කපලා, ඒබිසි ඇදලා සිමෙන්ති මිල නිසා විශාල ගැටවවක්. ගිවිසුම් අත්සන් කරලා.ඒවාට අවසර දෙන්න.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා</u>**

**මාර්තු 31 ට පෙර වැඩ නිම කරන්න කීවා.බිල් දාලා.දැන් මුදල් නෑ.මිනිස්සු කිව නිසයා කලේ .ඒ අය අමාරුවේ.ප්‍රාදේශීය ලේකම් එකෙත් මුදල් නෑළු.මිනිසුසන්ට ගැටළු.ඉහල දේශපාලන අධිකාරිය විශ්වාස කරලා.මේවාට මැදිහත්වෙන්න.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>**

**ග්‍රාමීය මාර්ග අමාත්‍යංශය පාරවල් කලා.සභා තිරනයක් ගත්තා ප්‍රතිපූර්නය කරන තෙක් ගෙවන්න.**

**සභා ගිවිසුම් අත්සන් කරලා.50% ටවත් ගෙවන්න.ඒ මිනිස්සු විශ්වාසෙටයි කලේ.ගිවිසුම සභාව එක්කයි.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ජීවන් රණතුංග මහතා ගේ යෝජනාව අනුව</u> ජල සම්බන්ධතා ලබාදීමේදී මාර්ගය පළුදු කිරීම සඳහා ප්‍රාදේශිය සභාව මගින් ලබාගන්නා ඇපමුදල නැවත ලබාදීමේදි ඇතිවන ගැටළු නිරාකරනය කිරීම කඩිනම් කිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී දයා කස්තුරි මිය විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා

**05-04.** **වතුයාය සිප්යුරු පෙරපාසැල අසලින් ගලා බසින ගොඩපරගහඇල වේල්ල පැතිබැම්ම සැකසීමේ යෝජනාව.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී දයා කස්තුරි මිය
**වතුයාය සිප්යුරු පෙරපාසැල අසලින් ගලා බසින ගොඩපරගහඇල වේල්ල පැතිබැම්ම සැකසීම සඳහා රු.450000.00ක් මුදලක් වෙන්කර ලබාදෙන ලෙස යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ප්‍රේමා ගම්ලත් මිය

**එම යෝජනාව ස්ථිර කරමි.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxx**
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී දයා කස්තුරි මියගේ යෝජනාව අනුව **වතුයාය සිප්යුරු පෙරපාසැල අසලින් ගලා බසින ගොඩපරගහඇල වේල්ල පැතිබැම්ම සැකසීම සඳහා රු.450000.00 ක මුදලක් වෙන්කර නීත්‍යානුකූලව කටයුතු කිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.මහින්ද විජේකුමාර මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා

**05-05.සූදාගල කොට්ඨාශයේ ක්‍රියාත්මක කිරිමට ඇති එහෙත් දැනට පවතින මිල ගනන් යටතේ ආරම්භ කිරිමට නොහැකි කර්මාන්ත නව මිල ගනන් යටතේ සංශෝධනය කරදෙන ලෙස සිදු කරන යෝජනාව.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.මහින්ද විජේකුමාර මහතා

**සූදාගල කොට්ඨාශයේ ක්‍රියාත්මක කිරිමට ඇති එහෙත් දැනට පවතින මිල ගනන් යටතේ ආරම්භ කිරිමට නොහැකි පහත සඳහන් කර්මාන්ත නව මිල ගනන් යටතේ සංශෝධනය කර දෙන ලෙස යෝජනා කරමි.**

**1.මහවත්ත කන්ද ගලහේන මාර්ගය කොන්ක්‍රිට් කිරීම.රු.111612.81**
**2.වැලිහිඳ ප්‍රේමසිරි මයාගේ නිවස අසල පාර කොන්ක්‍රිට් කිරිම. රු.111612.81**

**3.**මහවත්ත කන්ද නිමල් මහතාගේ නිවස අසල පාර කොන්ක්‍රිට් කිරිම රු.**111612.81**
**4.**දෙමන් හන්දිය අජිත් මයාගේ නිවස අසල මාර්ගය කොන්ක්‍රිට් කිරිම.**111612.81**
**5.**වැලිහිඳ ලක්සිරි මයාගේ නිවස අසල මාර්ගය කොන්ක්‍රිට් කිරිම.**111612.81**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ප්‍රේමා ගම්ලත් මිය**

**එම යෝජනාව ස්ථිර කරමි.**

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා -**

**කාර්මික නිලධාරිවාර්තා නව මිල ගනන් යටතේ සංශෝධනය කරමු.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.මහින්ද විජේකුමාර මහතාගේ යෝජනාව අනුව සූදාගල කොට්ඨාශයේ ක්‍රියාත්මක කිරිමට ඇති එහෙත් දැනට පවතින මිල ගනන් යටතේ ආරම්භ කිරිමට නොහැකි ඉහත සඳහන් කර්මාන්ත කාර්මික නිලධාරී වාර්තාගෙන නව මිල ගනන් යටතේ සංශෝධනය කිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම් ජයරත්න මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා**

**05-06.**කොට්ඨාශය තුල ඇති මාර්ග ජේසිබී යන්ත්‍රයක් යොදා කාණු ගොඩදැමීම හා උරහිස් ප්‍රතිසංස්කරනය කිරීමේ යෝජනාව.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම් ජයරත්න මහතා**

**කොට්ඨාශය තුල ඇති මාර්ග ජේසිබී යන්ත්‍රයක් යොදා කාණු ගොඩදැමීම හා උරහිස් ප්‍රතිසංස්කරනය කිරීමට යෝජනා කරමි.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා.**

**එම යෝජනාව ස්ථිර කරමි.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම් ජයරත්න මහතා විසින් ඉදිරිපත් කරනු යෝජනාව අනුව</u> කොට්ඨාශය තුල ඇති මාර්ග ජේසිබී යන්ත්‍රයක් යොදා කාණු ගොඩදැමීම හා උරහිස් ප්‍රතිසංස්කරනය කිරීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

**05-07. අධිකාරිය සිට පංසල දක්වා ඇති මාර්ගය ඉතිරි කොටස කොන්ක්‍රිට් කිරීමේ යෝජනාව**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම් ජයරත්න මහතා</u>**

**අධිකාරිය සිට පංසල දක්වා ඇති මාර්ගය ඉතිරි කොටස කොන්ක්‍රිට් කිරීමට යෝජනා කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා.</u>**

**එම යෝජනාව ස්ථිර කරමි.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම් ජයරත්න මහතා විසින් ඉදිරිපත් කරනු යෝජනාව අනුව</u> අධිකාරිය සිට පංසල දක්වා ඇති මාර්ගය ඉතිරි කොටස කොන්ක්‍රිට් කිරීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

**<u>යථා පරිදි කල් දී ඇති යෝජනා යටතේ ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන අනෙකුත් යෝජනා.</u>**

## <u>2022.05.20 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක 05-08 හි උද්ධෘතය</u>

**05-08.** **කුරුවිට ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ රත්නපුර කොළඹ මාර්ගයේ 86/1බෝක්කුවේ සිට නාමල්දෙනිය ගොවිජන සේවා මධ්‍යස්ථාන දක්වා පාර මධ්‍ය ලක්ෂයේ සිට දෙපසට මීටර 150 තුල නව වරිපනම් ගැසට් කිරිම -මහජන විරෝධය සම්බන්ධව පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් යොමු කර ඇති ලිපිය සම්බන්ධ යෝජනාව.**

**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා -</u>**

**මේ සම්බන්ධයෙන් මා විසින් ප්‍රථමයෙන් කරුනු දැක්වීමක් කල යුතුයි.**

පළාත් පාලන සහකාර කොමසාරිස් ගේ 2021.12.23 දිනැති ලිපියෙන් කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ රත්නපුර කොළඹ මාර්ගයේ 86/1බෝක්කුවේ සිට නාමල්දෙනිය ගොවිජන සේවා මධ්‍යස්ථාන දක්වා පාර මධ්‍ය ලක්ෂයේ සිට දෙපසට මීටර 150 තුල නව වරිපනම් ගැසට් කිරිම පිලිබඳ පැවති මහජන විරෝධය සම්බන්ධව එම පුරවැසියන් 2021.12.01 දින කරන ලද සාකච්ඡාවෙදි ගත් තීරන තීන්දු ගැන දැනුම් දී ඇත.ඒ අනුව අදාල වරිපනම් බදු 2021 වසරේ සිට ගෙවිම් කිරිමට යෝජිත බදු ගෙවන්නන්ගේ සංවිධානය නමින් අත්සන් කර ඇති පුරවැසියන් එකගතාවය දක්වා ඇති බවත් වරිපනම් සිමාවේ ජනතාවවෙත කුරුවිට ප්‍රාදේශීය ය සභාවවිසින් සැපයියයුතු සේවාවන් නිසි පරිදි නොසැපයීම හේතුවෙන් මෙම වරිපනම් ගෙවිමට විරුද්ධවිමට හේතු විඇති බවත් ,ඒ පිලිබඳ නිරීක්ෂනය අනුව බැහැර කල නොහැකි තත්වයේ පවතින බවත්

එබැවින් සභාව පාර්ශවයෙන් ද සිදුවී ඇති දූර්වලතා සැලකිල්ලට ගෙන 2021 වර්ෂය දක්වා වන අයකිරිම් සඳහා සහනයක් සැලසිම පිලිබඳවද සලකා බලා විධිමත් සභා තීරනයක් ගැනිම සුදුසුබවත් වරිපනම් සීමා නිශ්චිතව පෙන්වා දි එම සිමාවේ ජනතාව වෙත සභාව විසින් සැපයියයුතු සේවාවන් නිසි පරිදි සැපයිමට පියවර ගන්නා ලෙසත් සභා තීරන ක්‍රියාත්මක කිරිමට විෂය භාර ගරු අමාත්‍යවරයාගේ ලෙස ගරු ආණ්ඩුකාර තුමාගේ අනුමැතිය අවශ්‍ය වන්නේනම් ඒ සඳහා විධිමත්නිවැරදි සභා තීරනයක් සමග ඉදිරිපත් කරන ලෙසත් දන්වා ඇත.

මෙම තත්වය අනුව මෙම වරිපනම් සිමාවට අදාලව සියළු සංවර්ධන කටයුතු සමාලෝචනය කරමින් වාර්තාවක් 2022.04.27 දිනැතිව කුරුවිට ප්‍රාදේශීය සභාව මගින් සැකසූ අතර එය පරිපාලන කටයුතු පිලිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්(ඔම්බුඩ්ස්මන්),පළාත් පාලන සහකාර කොමසාරිස්,යෝජිත බදු ගෙවන්නන්ගේ සංගමය වෙත යොමු කර ඇති අතර එම වාර්තාවේ සඳහන් අයුරින් 2012.03.23 දිනැති ගැසට් පත්‍රය මගින් උක්ත ගම් ප්‍රදේශය දියුණු ගම් ප්‍රෙද්ශයක් ලෙස ප්‍රකාශ කර 2014 තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරුව යටතේ මෙම දේපල තක්සේරු කර 2019 වසරේ දෙවන කාර්තුවේ සිට දේපල වටිනාකමින් 6% ප්‍රමානයක් සභාව විසින් වාර්ෂිකව වරිපනම් ලෙස අය කරයි. මෙම ප්‍රෙද්ශයේ නොකඩවා සීමිත පිරිසක් පමනක් වරිපනම් ගෙවිමට කටයුතු කරන අතර 2021 වසරේදි මෙම ප්‍රදේශය තුල සමස්ත වරිපනම් ඒකක අතරින් 921 ක ප්‍රමානයක් ගෙවිම් කර ඇති අතර 2022.03.31 දිනට හිඟ වරිපනම් ප්‍රතිශතය සමස්ථ වරිපනම් හිඟයෙන් 40% වේ.එසේම මෙම සීමාවේ ප්‍රාදේශීය සභාව මගින් සිදු කර ඇති සංවර්ධන සේවාවන් පිලිබඳව විධිමත් වාර්තාවක් ලබාගත් අතර මාර්ග සංවර්ධන කටයුතු අනුව සියළු මාර්ග කොන්ක්‍රිට් කර ඇත.වීදිපහන් සවිකිරිම් සිදුකර ඇත.කසල රැස්කිරිම අඛන්ඩව සිදු කරයි.ඒ හැරුන විට ආදාහනාගාර සේවා,පුස්තකාල ,කාබනික පොහොර ව්‍යාපෘතිය විසල් ව්‍යාපෘතිය ජලය ලබා දිමට නල එලිම ආදි සේවාවන් රැසක් සිදු කර ඇත.මෙම තත්වය යටතේ කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ රත්නපුර කොළඹ මාර්ගයේ 86/1බෝක්කුවේ සිට නාමල්දෙනිය ගොවිජන සේවා මධ්‍යස්ථාන දක්වා පාර මධ්‍ය ලක්ෂයේ සිට දෙපසට මීටර 150 තුල නව වරිපනම් ගැසට් කිරිම සම්බන්ධ විරෝධය පිලිබඳ තීරනය ගත යුතුය.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා :-</u>

මෙම ප්‍රදේශය වරිපනම් ගැසට් කරලා.අපියි ඒක කලේ .අපිට පුළුවන්ද එය ඉවත් කිරිමට.මේ වරිපනම් කපා හැරිම කලහැකිද?ආබාධිත අයට හා මිටර් 150 සිමාවෙන් පිට අයට සහනය දිය හැකියි.කරුනු සොයාබලා තීරනයක් ගන්න.මේ තත්වය මත යම් සහන කාලයක් දිය හැකියි.සාධාරනව යුක්ති යුක්ත කල යුතුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ.විජේසිරි මහතා

විරෝධතාව සම්බන්ද සාකච්ජාව සිදු කර දැනුම් දුන්නා.විරෝධතා දැක්විමට හැකියි.ප්‍රායෝගිකව බලලයි සාධාරනයක් දිය යුත්තේ.ඇතැම් අයට ගැටළු තියෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩිලාන් දර්ශන මහතා

වරිපනම් එකතු කිරිම හා සභා සේවා සැපයිම යනු දෙකක්.අනවබෝධය නිසයි මේ ගැටළු. කසල එකතු කරන්නැත්නම් වරිපනම් ගෙවන්න බෑ කියලා එකක් නෑ.මේ ප්‍රදේශ දියුණු ගම් ප්‍රදේශ. විරෝධතා ගේන්න බෑ. ජනතාවගේ නොදැනුවත් කම.වරිපනම් ගෙවන්න හේතුවන ප්‍රස්තුතය කියා දිය යුතුයි.නාගරික ප්‍රදේශ, අර්ධ නාගරික ප්‍රදේශ,දියුණු ගම් ප්‍රෙද්ශ ආදී ලෙස කලාප වර්ග කර තියෙනවා. උදාහරනයක් ලෙස කොළඹ රත්නපුර මාර්ගයේ යාබද ඉඩමක පර්චස් එකක් ලක්ෂ ගානක් වෙනවා. ඉතා වටිනා ඉඩම්.එවැනි පරිසරයක සිටින අයයි රජයට මේ බදු ගෙවන්නේ.මේ කලාප සීමා වලට එහා අය ත් ඇතුලත් වෙලා නම් ඒවා නිවැරදි කරන්න.ස්කීම් ප්‍රෙද්ශයේ බහුතරය කැමතියි. මේ කාරනා නිවැරදිව පැහැදිලි කරන්න.වීදිලාම්පු දැමිම හෝ නොදැමීම නෙවෙයි.මේක දෙකක්.බද්ධ කරන්න එපා. එතකොට ගැටළුව සභාවට.මේ නිතිය නොදැනුවත් කම.ඒ නිති වෙනස් කරන්න නෛතික බලයක් සභාවට නෑ.මේ **2014** තක්සේරුව.දැන් කලොත් දෙගුනයක් වෙයි.ඇත්ත පැහැදිලි කරලා සේවාවන් දෙන එක හරි.විසල් ජලයත් දෙන්න කටයුතු කරනවා.සභාවට ආදායම් අවශ්‍යයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ. කුලරත්න මහතා

පසුගිය කාල වල මිනිස්සු අපිට කියලා හදවාගන්න ආවේ වරිපනම්.ඉල්ලිම් රැසක් තිබුනා.උක්වත්ත කැල්ල වරිපනම් නොතිබුන කාලේ අතින් මුදල් ගෙවලා ඒ අය කසල ඉවත්කර ගත්තා.පුද්ගලික මත වාද නෙමෙයි.තක්සේරු මුදල වෙනස් කරන්නත් බෑනේ.මිනිස්සුන්ට හානිකර නැති තීන්දුවක් ගමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්. ජයරත්න මහතා

වරිපනම් බදු ඉවත් කරගන්න බේරුම් කරන්න අධිකරනයට පමනක් හැකියි.දන්වා අරින්න.වරිපනම් බදු අය කරන්නේ නිර්නායක මතයි.මේවා දියුණු ගම් ප්‍රදේශ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ. කුලරත්න මහතා

අනවශ්‍ය දේ කතා කිරිම පලක් නෑ.පාර්ලිමේන්තුවේ පවා ජනතාවට සහන පිලිබඳව නම් කමක් නෑ.පලක් ඇති දේ විතරක් න්‍යාය පත්‍රයට දාන්න.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා -

මේ සියල්ල දැනුවත්ව මේ ලිපිය සභාවට යොමු කලේ ඇයි.උප සභාපතිතුමා කීවා වගේ අටක් දහයක් දෙනාගේ දේශපාලන අදහස් නිසා මේ තත්වය උද්ගත වෙලා.පරාජිත දේශපාලකයන්.ජනතා නියෝජිතයන් වෙන්න බැරි උන නිසා දැන් ද්වේෂයෙන් යුක්තව කටයුතු කරනවා. රංජිත්,දැල,දනසිංහ,රාජා,හතර දෙනා මුල්වෙලා.ට්‍රැක්ටරය නතර කලාම හැමෝම කසල ටික දානවා.වරිපනම් ගෙවන්නැත්නම් නොදා ඉන්න ඕනි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා :-

කසල ගැනිම නතර කරන්න එපා.මීටර් **150** ට වැඩි අය ඉවත් කරන්න.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා-

මේ සියළු කරුණු සලකා බලා කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ රත්නපුර කොළඹ මාර්ගයේ 86/1 බෝක්කුවේ සිට නාමල්දෙනිය ගොවිජනසේවා මධ්‍යස්ථාන දක්වා පාර මධ්‍ය ලක්ෂයේ සිට දෙපසට මීටර 150 තුල නව වරිපනම් ගැසට් කිරිම සම්බන්ධයෙන් වන අය කිරීම්වල කිසිදු කපාහැරීමක් සිදු නොකිරීමටත් , සහන ලබාදීමට හැකියාව ඇති ද යන්න සලකා බැලිම සඳහා විරෝධතා ඉදිරිපත් කරන අයගේ ඉල්ලීම් තක්සේරු දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර එම දෙපාර්තමේන්තු තීරණය මත පියවර ගැනීමටත් නව තක්සේරුවක් ලබා ගැනිම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරිමටත් ගෙවිම් පැහැර හරින පුද්ගලයන් සඳහා සභා පනත ප්‍රකාරව නීත්‍යානුකූලව කටයුතු කිරීමටත් යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

එම යෝජනාව ස්ථිර කරමි.

Xxxxxxxxxxxxxxxx ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව හා කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ රත්නපුර කොළඹ මාර්ගයේ 86/1 බෝක්කුවේ සිට නාමල්දෙනිය ගොවිජනසේවා මධ්‍යස්ථාන දක්වා පාර මධ්‍ය ලක්ෂයේ සිට දෙපසට මීටර150 තුල නව වරිපනම් ගැසට් කිරිම මහජන විරෝධය සම්බන්ධව පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් යොමු කර ඇති ලිපිය අනුව කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ රත්නපුර කොළඹ මාර්ගයේ 86/1 බෝක්කුවේ සිට නාමල්දෙනිය ගොවිජන සේවා මධ්‍යස්ථානය දක්වා පාර මධ්‍ය ලක්ෂයේ සිට දෙපසට මිටර් 150 තුළ නව වරිපනම් ගැසට් කිරිම සම්බන්ධයෙන් වන අය කිරීම්වල කිසිදු කපාහැරීමක් සිදු නොකිරීමටත් , සහන ලබා දිමට හැකියාව ඇත ද යන්න සලකා බැලීම සඳහා විරෝධතා ඉදිරිපත් කරන අයගේ ඉල්ලීම් තක්සේරු දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර එම දෙපාර්තමේන්තු තිරණය මත පියවර ගැනීමටත් නව තක්සේරුවක් ලබාගැනීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීමටත් ගෙවීම් පැහැර හරින පුද්ගලයන් සඳහා සභා පනත ප්‍රකාරව නීත්‍යානුකූලව කටයුතු කිරීමටත් සහා අනුමැතිය ලබා දීමට ඒකමතිකව මහා සභා සම්මත විය.xxxxxxxxxxxxxxxxx

**05-09.** දීප්ති ග්‍රාම සංවර්ධන සමිතිය ,ගොරකාඇල ,දොඩම්පේ,සභාපති විසින් ඉදිරිපත්කර ඇති ප්‍රාදේශිය සභා අරදමුදල් යොදවා වැඩ නිමකිරිමට භාරගත් කර්මාන්ත කොන්ත්‍රාත්තු සම්බන්ධ යෝජනාව.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා -

දීප්ති ග්‍රාම සංවර්ධන සමිතිය ,ගොරකාඇල ,දොඩම්පේ,සභාපති විසින් ඉදිරිපත්කර ඇති ප්‍රාදේශිය සභා අරදමුදල් යොදවා වැඩ නිමකිරිමට භාරගත් කර්මාන්ත කොන්ත්‍රාත්තු සම්බන්ධ ඉල්ලිමක් සිදුකර ඇතිඅතර දිනෙන් දින ඉතා සීග්‍රයෙන් ඉහල යන ඉදිකිරිම් ද්‍රව්‍ය වල මිල හමුවේ

අදාල ඇස්තමේන්තු වල සදහන් මිල ගනන් වලට මෙම කර්මාන්තය නිම කල නොහැකි බවත්

දැනුම් දී ඇත.ඒ අනුව කිරිවැල්දෙනිය එච්.කේ.තිලකරත්න මහතාගේ මහතාගේ නිවස දෙසට යන මාර්ගය කොන්ක්‍රිට් කිරිම -රු.204982.97,කුරුගම්මෝදර සිට අධිකාරිය පන්සල දෙසට මාර්ගය දුෂ්කර ස්ථාන කොන්ක්‍රිට් කිරිම-රු.273778.39 ලෙස ඇස්තමේන්තු කල කර්මාන්ත සම්බන්ධයෙන් ගිවිසුම් අත්සන් කර ඇත්නම් එම මුදල ඇතුලේම සංශෝධනය කර සිදු කිරිමට යෝජනා කරමි.එසේම සබාවේ මූල්‍ය තත්වය යහපත් වූවිට මෙම ගෙවිම් සිදු කල හැක.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා
එම යෝජනාව ස්ථිර කරමි.ඒ අය බඩුත් ගෙනත්.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

Xxxxxxxxxxxxxxx ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව හා දීප්ති ග්‍රාම සංවර්ධන සමිතිය ,ගොරකාඇල ,දොඩම්පේ,සභාපති විසින් ඉදිරිපත්කර ඇති ප්‍රාදේශිය සභා අරදමුදල් යොදවා වැඩ නිමකිරිමට භාරගත් කර්මාන්ත කොන්ත්‍රාත්තු සම්බන්ධ ලිපිය අනුව කිරිවැල්දෙනිය එච්.කේ.තිලකරත්න මහතාගේ මහතාගේ නිවස දෙසට යන මාර්ගය කොන්ක්‍රිට් කිරිම -රු.204982.97,කුරුගම්මෝදර සිට අධිකාරිය පන්සල දෙසට මාර්ගය දුෂ්කර ස්ථාන කොන්ක්‍රිට් කිරිම-රු.273778.39 ලෙස ඇස්තමේන්තු කල කර්මාන්ත සම්බන්ධයෙන් ගිවිසුම් අත්සන් කර ඇත්නම් එම මුදල ඇතුලේම සංශෝධනය කර සිදුකිරිමට මහා සභා අනුමැතිය ලබා දිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx

**05-10.** ලිට්රෝ ගෑස් මිල වැඩිවීම සම්බන්ධව ජේ.කේ.එන්ට්‍රප්‍රයිසස් ආයතනය මගින් ඉදිරිපත් කර ඇති 2022.04.19 ලිපිය සම්බන්ධ යෝජනාව.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා -
ලිට්රෝ ගෑස් මිල වැඩිවීම සම්බන්ධව ජේ.කේ.එන්ට්‍රප්‍රයිසස් ආයතනය මගින් ඉදිරිපත් කර ඇති 2022.04.19 දිනැති ලිපිය අනුව සභාවේ ආදාහනාගාරයට සපයන 37.5 කි.ග්‍රෑ.සිලින්ඩරයක මිල 2022.04.08 දින සිට රු.17188.00 දක්වා මිල ඉහල ගොස් ඇත.ඒ අනුව සභාවේ ආදාහනාගාරයට අවශ්‍ය ගෑස් මෙම සංශෝධිත මිල ගනන් යටතේ 37.5 කි.ග්‍රෑ.සිලින්ඩරයක් රු.17188.00 බැගින් .කේ.එන්ට්‍රප්‍රයිසස් ආයතනය වෙත ගෙවා මිලදී ගැනිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා :-
එම යෝජනාව ස්ථිර කරමි

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා -

තවත් ගැටළුවක්.දැන් ආදාහනාගාරය පාඩුයි.කාර්මික නිලධාරි වාර්තා ගත්තා.ගාස්තුව සම්බන්ද තීරනයක් ගන්න වෙච්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ.විජේසිරි මහතා

ගෑස් ගැටළුව ලංකාවටම පොදුයි.අපි මේ ගැන සොයා බලමු. දෙහිඕවිට,රත්නපුර අපිටත් වඩා අඩු මිලට ඒ කටයුතු කරනවාලු.මිල ගනන් බලමු.දැනට මිල වැඩි කිරීම ප්‍රමාද කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා

මේ දිනවල සේවාවක් ලෙස කරමු.ජනතාව ඉතාමත් අසීරුවේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩිලාන් දර්ශන මහතා
පාඩුව විධිමත්ව සබාවට ඉදිරිපත් කරන්න.දැරිය හැකි පාඩුවක්ද බලමු.ඒ දක්වා ඇති වාර්තාව අනුව නියමිත නිවැරදි දත්ත එන්නේ නෑ.නිවැරදි ගනනයක් කරලා.නිවැරදි ව පාඩුව බලමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා

තවත් මුදලක් වැඩි කලොත් අද රටේ තත්වය අනුව ජනතාවට ලොකු ගැටළුවක්.රටේ ආර්ථිකය යහපත් වන තුරු මේ ගාස්තු වැඩි කරන්න එපා.සබාවට සංග්‍රහ එපා.ඒ මුදල හරි අඩු කරලා ජනතාවට මේ සහනය දෙන්න. ගාස්තු වැඩි කරන්න එපා.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා :-

සබාවට සංග්‍රහ එපා.ඒ ආදාහනාගාර පාඩුව පියවන්න.එසේම මේවයේ විද්‍යාත්මක කරුනුත් තියෙනවා.ගෑස් එකේ යට ටික වතුර බඳුනක දැම්මොත් යන ප්‍රමානය අඩුයි.තාක්ෂනික කරුනක්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ.විජේසිරි මහතා

එකඟයි.සභාවට තේ එපා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ.කුලරත්න මහතා

වතුර බෝතලුත් එපා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා

සභාවට වතුර බෝතල් අනවශ්‍යයි.ආදාහනාගාරයේ මිල වැඩි කිරීම තාවකාලිකව නවත්වමු.නිලධාරීන් සියළු දෙනාටත් කම්වු දීමනා නවත්වන්න.ලබන සතියට වාර්තාවක් දමන්න.එසේම මේ වසරේ වැඩි වියදම් එපා.විනෝද චාරිකා,උත්සව එපා.පාර්ටි එපා.
අපි සභාවට ආ මුල් කාලේ ඉතාමත් අඩු මුදලකට තේ දුන්නා.ඒකත් සබාවට බරක්.ඒවාත් එපා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩිලාන් දර්ශන මහතා

ආදාහනාගාරයේ මිනී තියන ස්ටැන්ඩ් එක දිරලා.ඉතාමත් අපහසුවෙන් කටයුතු කරන්නේ.උදය මල් ශාලාව සාමාන්‍යයෙන් මෙහේ ගොඩක් අවමංගල වැඩ කරන්නේ.ඔවුන්ගෙන් ඉල්ලුවොත් පරිත්‍යාගයක් ලෙස දෙයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා

උදය මල් ශාලාවෙන් ඉල්ලීම කරන්න.එතුමා ලබාදෙයි.මිනී තියන ට්‍රොලියත් ඉල්ලන්න.එයත් වැදගත්.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා -
අපි උදය මල් ශාලාවෙන් ඉල්ලීම කරමු.ආදාහනාගාරයට පරිත්‍යාග ලෙස උපකරන ඉල්ලලා.
එසේම අපි ලබන සභාවට ආදාහනාගාරයේ ගෑස් වියදම ලාභ පාඩු ආදිය වාර්තාවක් විධිමත්ව දමනවා.සබාවට තේ වතුර බෝතල් මීට පසු නෑ.පිල්ටරේ වතුර තියන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ.කුලරත්න මහතා
තේ වලට යම් මුදලක් එකතු කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.සී.එස්.ධනවර්ධන මහතා

මම ඉදිරි වාර වලට මහා සභාවේ තේ වේල දෙන්නම්. විශාල මුදලක් යන්නේ නෑ.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා :-

ස්තුතියි.ගරු මන්ත්‍රීතුමා.තනියම එපා.සභාවට ජනතාවට විශාල දේවල් ඔබතුමා කලා.තේ තනියම එපා. සම්මාදම් වෙමු.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා -
ගරු ධනවර්ධන මන්ත්‍රීතුමා ජූනි මාසෙට දෙන්න.මම ජූලි මාසෙට දෙන්නම්.

**මෙහිදි ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ.කුලරත්න මහතා අගෝස්තුමාසය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී දයා කස්තුරි මිය සැප්තැම්බර් මාසය ,_ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා ඔක්තොම්බර් මාසය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා නොවැම්බර් මාසය ලෙසසභාවේ සංග්‍රහ සිදු කිරිමට භාර ගත්හ.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින්_ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව හා. ලිට්රෝ ගෑස් මිල වැඩිවීම සම්බන්ධව ජේ.කේ.එන්ට්‍රප්‍රයිසස් ආයතනය මගින් ඉදිරිපත් කර ඇති 2022.04.19 ලිපිය අනුව සභාවේ ආදාහනාගාරයට අවශ්‍ය ගෑස් මෙම සංශෝධිත මිල ගනන් යටතේ 37.5 කි.ග්‍රෑ.සිලින්ඩරයක් රු.17188.00 බැගින් .කේ.එන්ට්‍රප්‍රයිසස් ආයතනය වෙත ගෙවා මිලදී ගැනිමට මහා සභා අනුමැතිය ලබා දිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

## 2020.05.20 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක 05-11 හි උද්‍ධෘතය

**05-11.**ලිට්රෝ ගෑස් මිලදි ගැනීම සම්බන්ධව_කේ.එන්ට්‍රප්‍රයිසස් ආයතනය මගින් ඉදිරිපත් කර ඇති **2022.04.28** ලිපිය සම්බන්ධ යෝජනාව

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

ලිට්රෝ ගෑස් මිලදි ගැනීම සම්බන්ධව_කේ.එන්ට්‍රප්‍රයිසස් ආයතනය මගින් **2022.04.28** දිනැතිව ලිපියක් යොමු කර ඇති අතර ගෑස් සිලින්ඩර් මිලදි ගන්නා ලෙස දැනුම් දි ඇත.මේ සම්බන්දව කාර්මික නිලධාරි වාර්තා ලබාගෙන ඇති අතර දැනට හිස් ගෑස් සිලින්ඩරයක් රු.**19500.00** ක් මුදලක් වන අතර සිලින්ඩර් මිලදි නොගන්නේ නම් ආපසු භාර දෙන ලෙස දන්වා ඇති බවත් එම නිසා දැනට ගෑස් සිලින්ඩර් නොමැති බැවින් පවතින අර්බුධය යටතේ සභාවට සිලින්ඩර්

**නොමැති වුවහොත් ආදාහනාගාරයට ගෑස් සපයා ගැනීමද ගැටළු විය හැකිබැවින් ඒ අනුව දැනට ආපසු දෙන පදනම මත සපයා ඇති ගෑස් සිලින්ඩර් සභාවට මිලදී ගැනීම සුදුසු බව දක්වා ඇත.ඒසේම ආපසු දෙන පදනම මත ආදාහනාගාරයට ගෑස් සිලින්ඩර් 12 ක් සපයා ඇති බව කිර්මික නිලධාරි වාර්තා කර ඇත.මේ සම්බන්ධව සභා තීරනයක් ලබා ගත යුතුය.**
**ඒ අනුව ලිට්රෝ ගෑස් මිලදි ගැනීම සම්බන්ධව_කේ.එන්ට්‍රප්‍රයිසස් ආයතනය මගින් 2022.04.28 දිනැතිව යොමු කර ඇති ලිපිය අනුව කරුනු සලකා බලා පුස්සැල්ල ආදාහනාගාරය සඳහා ගෑස් සිලින්ඩර් 12ක් මිලදී ගැනිමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා :-</u>

**එම යෝජනාව ස්ථිර කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ.කුලරත්න මහතා</u>

**අද පාර්ලිමේන්තුව රැස් වෙනවා.මේ සම්බන්ධව සාකච්ඡා වෙනවා.දැනට උත්තර දෙන්න එපා.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

**ගෑස් නැති උනොත් ගැටළුවක් වෙයි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>

**ගමු.තැන්පතුවක් තියමු.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා</u>

**මා ලග සිලින්ඩර් දෙකක් තියෙනවා.නැවත ගැනීමේ පදනම මත අවශ්‍ය වෙලාවක දෙන්නම්. දැනුම් දෙන්න.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින්_ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව හා ලිට්රෝ ගෑස් මිලදි ගැනීම සම්බන්ධව_කේ.එන්ට්‍රප්‍රයිසස් ආයතනය මගින් ඉදිරිපත් කර ඇති 2022.04.28 ලිපියඅනුව කරුනු සලකා බලා පුස්සැල්ල ආදාහනාගාරය සඳහා ගෑස් සිලින්ඩර් 12ක් මිලදී ගැනිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**2020.05.20 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක 05-18 හි සත්‍ය උද්‍යතයක් බවට සහතික කරමි.**

**එස්.එච්.ආර්.වීරක්කොඩි,**
**ලේකම්,**
**ප්‍රාදේශීය සභාව,කුරුවිට.**

**05-12.** කුරුවිට ප්‍රාදේශිය සභාවට අයත් වානිජ A සංකීර්ණයේ අංක 37 කඩ කාමරය අතුරු බදුකරුවෙත පවරාදිම , නම් සංශෝදනය කිරීම සම්බන්ධ යෝජනාව.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා -</u>

**කුරුවිට ප්‍රාදේශිය සභාවට අයත් වානිජ A සංකීර්ණයේ අංක 37 කඩ කාමරය බදුකරු වන කොස්ගල ,කහංගම කේ.ඩබ්. ඛේමා ප්‍රියදර්ශනී , විසින් අතුරු බදු කරු වන අංක 48/ ඊ. මැදගංගොඩැල්ල,පැරඩයිස් කුරුවිට පදිංචි ඒ.ජී.එස්.සමිත කුමාර ජයසේන මයා වෙත පවරාදිමට ඉල්ලීම් කර ඇති අතර පළාත් පාලන කොමසාරිස්ගේ අංක 03/2020 චක්‍ර ලේඛයේ සඳහන් පරිදි නම් සංශෝධනයට අවශ්‍ය ලේඛනද ඉදිරිපත් කර ඇත.**

**ඒ අනුව කුරුවිට ප්‍රාදේශිය සභාවට අයත් වානිජ A සංකීර්ණයේ අංක 37 කඩ කාමරය බදුකරු වන කොස්ගල ,කහංගම කේ.ඩබ්. ඛේමා ප්‍රියදර්ශනී , විසින් අතුරු බදු කරු වන අංක 48/ ඊ. මැදගංගොඩැල්ල,පැරඩයිස් කුරුවිට පදිංචි ඒ.ජී.එස්.සමිත කුමාර ජයසේන මයා වෙත පවරාදිමට කටයුතු සලසන ලෙස ඉල්ලිම් කර ඇති අතර ඒ සඳහා මහා සභා අනුමැතිය ලබා දිමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා :-</u>

එම යෝජනාව ස්ථිර කරමි.අදාල ක්‍රමවේදය අනුව කටයුතු කරන්න.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව හා කුරුවිට ප්‍රාදේශිය සභාවට අයත් වානිජ A සංකීර්ණයේ අංක 37 කඩ කාමරය බදුකරු වන කොස්ගල ,කහංගම කේ.ඩබ්. ඛේමා ප්‍රියදර්ශනී මියගේ ඉල්ලිම අනුව අංක 37 කඩ කාමරය අතුරු බදු කරු වන අංක 48/ ඊ. මැදගංගොඩැල්ල,පැරඩයිස් කුරුවිට පදිංචි ඒ.ජී.එස්.සමිත කුමාර ජයසේන මයා වෙත පවරාදිමට කටයුතු සලසන ලෙස ඉල්ලිම් කර ඇති අතර ඒ සඳහා මහා සභා අනුමැතිය ලබා දිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**05-13.** කුරුවිට, ශ්‍රී රම්‍යා ඇඹරුම්හල, කේ.ඒ.ඩී. අයිරීන් චන්ද්‍රලතා මිය විසින් ඉදිරිපත්කර ඇති, කුරුවිට නව නගර සැලැස්මට අනුව ඉවත් කිරිමට නියමිත තම වෙළඳසැල පිහිටි ඉඩම වෙනුවට නව ඉඩමක් ලබාගැනීම- ඉල්ලීමේ ලිපිය සම්බන්ධ යෝජනාව.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා -</u>

**කුරුවිට, ශ්‍රී රම්‍යා ඇඹරුම්හල, කේ.ඒ.ඩී. අයිරීන් චන්ද්‍රලතා මිය විසින් ,කුරුවිට නව නගර සැලැස්මට අනුව ඉවත් කිරිමට නියමිත තම වෙළඳසැල පිහිටි ඉඩම වෙනුවට නව ඉඩමක් ලබාදෙන ලෙස ඉල්ලිමක් සිදුකර ඇත. එම ඉල්ලිම අනුව තමන් දැනට ව්‍යාපාරය කරන ස්ථානය**

**පිරිසුදු ඔප්පු සහිත ස්ථානයක් බවත් සභාවෙන් ලබාදෙන ඉඩම වෙනුවෙන් වරිපනම් හා අනෙකුත් ගෙවිය යුතු මුදල් ගෙවීමට එකග බවත් ගෙවල් කුලිය ගෙවීම ඉවත් කර දෙන ලෙසද ඉල්ලා ඇත.**

**ඒ අනුව කුරුවිට, ශ්‍රී රම්‍යා ඇඹරුම්හල, කේ.ඒ.ඩී. අයිරින් චන්ද්‍රලතා මියගේ ,කුරුවිට නව නගර සැලැස්මට අනුව ඉවත් කිරිමට නියමිත දැනට පවත්වාගෙන යන වෙළඳසැල පිහිටි ඉඩම වෙනුවට කාර්මික නිලධාරී,ආදායම් පරිපාලක මගින් සොයාබලා වෙනත් සුදුසු ඉඩඇති තාවකාලික ස්ථානයක් ලබාදීමට යෝජනා කරමි.**

**මෙය නගර සංවර්ධන සැලැස්මට අවශ්‍යාවුවහොත් වෙනස් කල යුතු බැවින් තාවකාලිකව දීමට සිදුවේ.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>

එම යෝජනාව ස්ථිර කරමි.මේ ස්ථානය නගරයේ පැරණිම තැනක්. කුරුවිට ග්‍රාමෝදය මණ්ඩල කාලේ ගඟට වතුර බස්සන්න ඔතනින් මැන් හෝල් එකක් දැම්මා.ඒ කාලේත් ඒ අය උදව් කලා.අපි පාසැල් කාලේත් හිටිය පිරිසක්.කාන්තාවක් කරන ව්‍යාපාරයක්.උදව් කරන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ.විජේසිරි මහතා</u>

**මිනිස්සුන්ට වැදගත් සේවයක් සිදුකරන්නේ.පැරණිම ව්‍යාපාරයක්.සුදුසු ස්ථානයක් දෙන්න.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ.කුලරත්න මහතා</u>

**බෝගහඅසල ස්ථානය දුන්නාට එතන ඉඩ මදි.මේ ව්‍යාපාර ස්ථානයේ උඩ තට්ටුවත් කැඩුවා.ඒත්කිසි කරදරයක් නැති පිරිසක්.අපිට හිතවත්.සුදුසු ස්ථානයක් දෙන්න.**

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා :-</u>

**ගරු හිටපු උප සභාපති සිරිපාල විරසේකර මහතා හට එතුමාගේ ජීවිත කාලේ මිය පරලොව යනතුරු යම් ආදායමක් ලබාගන්න තැනක් දෙන්න.ගෙවීමට අවශ්‍ය මුදල වගකිම අපි භාරගන්නවා. බිම් බද්ද වැනි ගෙවීම්.ඒ අය ඉන්න කාලේ කල යෝජනා නිසානේ වතුර බොන්නේ.මේකත් පිනක්.වෙන කව්රුවත් මෙහෙම ඉල්ලන්නේ නෑ.මේක දෙන්න.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.සී.එස් ධනවර්ධන මහතා</u>

**මේ කරුන මාත් දන්නවා.ඉතා අමාරු නිසයි ඉල්ලන්නේ.හැකි උදව්වක් කරන්න.අනුමත කරනවා.මාත් හැකි උදව්වක් කරනවා.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංජිත් මෙන්ඩිස් මහතා</u>

**මිරිස්මෝලේ අක්කා.දැනට ව්‍යාපාරය පවත්වාගෙන යන ස්ථානය ගංවතුරට යටවෙනවා.මේ ස්ථානයේ සේවකයන් පස් දෙනෙකුත් ඉන්නවා.මිරිස්,වී මෝලට ඉඩ ඇති ස්ථානයක් දෙන්න.එසේම උපසභාපතිතුමා කිව ලෙස සිරිපාල අප්පොට හැකි ලෙස තැනක් දෙන්න. මාත් දායක වෙනවා උදව් කරන්න.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා -

**කාර්මික නිලධාරී,ආදායම් පරිපාලක මගින් සොයාබලා වෙනත් සුදුසු ඉඩඇති ස්ථානයක් තාවකාලිකව ලබාදෙමු.එසේම සිරිපාල අප්පොට දෙන්න වෙන්නේ මහජන ක්‍රීඩාංගනය ඉදිරිපිට තැනක්.පට්ටලේ හිමිකරුට අදාල ස්ථානයට යන්න කිවා.ඒ අය ගියාම ඉදිරි කටයුතු කරමු.එතුමාට විතරයි.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව කුරුවිට, ශ්‍රී රම්‍යා ඇඹරුම්හල, කේ.ඒ.ඩී. අයිරීන් චන්ද්‍රලතා මියගේ ,කුරුවිට නව නගර සැලැස්මට අනුව ඉවත් කිරිමට නියමිත, දැනට පවත්වාගෙන යන වෙළඳසැල පිහිටි ඉඩම වෙනුවට කාර්මික නිලධාරී,ආදායම් පරිපාලක මගින් සොයාබලා වෙනත් සුදුසු ඉඩඇති තාවකාලික ස්ථානයක් ලබාදිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**05-14.** **කුරුවිට නගරයේ නව වෙළඳ සංකීර්ණය පිටුපස බිම් කොටස මැනීම වෙනුවෙන් බිල්පත් ගෙවීම සම්බන්ධ යෝජනාව.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා -

**කුරුවිට නගරයේ නව වෙළඳ සංකීර්ණය පිටුපස තාවකාලික කඩ වෙනුවට ස්ථිර දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකර එම ස්ථානය ව්‍යාපාරිකයන්ට ලබාදීමට 2021.පෙබරවාරි මස සභාවේදී තීරනය විය.අදාල සභා තිරනය අනුව එම ස්ථානයේ භූමිය නිරවුල් කරගැනිමට මැනුම් කටයුතු සිදු කරන ලදී.ඒ අනුව අදාල මැණිම් කටයුතු ගුරුබැල්කඩ ,එරත්නපාර මිනින්දෝරු එම්.ජී.විමලසිරි මහතා විසින් සිදු කල අතර ඒ සඳහා රු.45000.00 ක මුදලක් ගෙවිම් කිරිමට බිල්පත් ඉදිරිපත් කර ඇත.**
**2021 වර්ෂයේදී සිදු කල කාර්යක් බැවින් එය නය හිමි වෙන් කිරිමටද නොහැකි විය.ඒබැවින් කුරුවිට නගරයේ නව වෙළඳ සංකීර්ණය පිටුපස බිම් කොටස මැනීම වෙනුවෙන් රු.45000.00 ක මුදලක් මිනින්දෝරු එම්.ජී.විමලසිරි මහතා වෙත සමුච්චිත අරමුදලින් ගෙවිම් කිරිමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා :-
එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා -

**දේශිය නය සංවර්ධන අරමුදලින් නය දෙනවාලු.ඒ අය එකහයි.නය දුන්නොත් හදලා අක් මුදල් අරන් දෙනවා.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ.කුලරත්න මහතා :-

**ඒ මිනුම් ගාස්තුව ගෙවන්න.** යෝජනාව ස්ථිර කරමි. අද රටේ සියළු ඉදිකිරීමක්ම නතර කරලා.මහා පරිමාන ඉදිකිරීම් ව්‍යාපෘතිද නතර කරලා.රටේ තත්වය බලලා මේ සම්බන්ධ ඉදිරි කටයුතු කරන්න. රටේ ආර්ථිකය ගොඩනැතුන පසු ආරම්භ කරන්න.එහෙත් මේ භූමිය නිරවුල් කර තබා ගැනිම වැදගත්.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව කුරුවිට නගරයේ නව වෙළඳ සංකීර්ණය පිටුපස බිම් කොටස මැනීම වෙනුවෙන් රු.45000.00 ක මුදලක් මිනින්දෝරු එම්.ජී.විමලසිරි මහතා වෙත සමුච්චිත අරමුදලින් ගෙවීම් කිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**05-15. කුරුවිට ප්‍රාදේශිය සභා ප්‍රධාන කාර්යාලයේ හා කාර්යාල පරිශ්‍රයේ ( පුස්තකාලයද ඇතුලත්ව)අත්‍යවශ්‍ය ස්ථානවලට අවම ප්‍රමානයෙන් සිසීටිවි කැමරා සවි කිරීමේ යෝජනාව.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා -

**කුරුවිට ප්‍රාදේශිය සභා ප්‍රධාන කාර්යාලයේ හා කාර්යාල පරිශ්‍රයේ ( පුස්තකාලයද ඇතුලත්ව)අත්‍යවශ්‍ය ස්ථානවලට අවම ප්‍රමානයෙන් සිසීටිවි කැමරා සවි කිරීමට යෝජනා කරමි.**

මේ සභාවේ නොදිරන කසලකාමරය ගිනි ගත්තා,වාහන වල පැට්‍රල්,ඩීසල් ඇදපු ගැටළු,නැති අන දේවලුත් තව ඇති.ඒ නිසා අත්‍යවශ්‍ය තැන්වලට මේ කැමරා සවි කිරිම වැදගත්.මිල ගනන් කැඳවලා කල යුතුයි.එසේම මේ වෙලාවේ රාජ්‍ය වියදම් පාලනය කිරීමේ ජාතික අයවැය චක්‍රෙල්ඛය 03/2022 අනුව මිලදීගැනීම් කල නොහැකි නිසා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය අරන් කල යුතුයි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා :-
එම යෝජනාව ස්ථිර කරමි.

අවස්ථා කිපයක සුළු සුළු ගැටළු සිදු වුනා.ආසන්නම සිදුවීම සභාවේ රථය ගිනිගැනීම.පොලිසිය කියන තෙක් දන්නේ නෑ.මේවාට වගකිව යුතු අය වගකිම් දරලා නෑ.රාජ්‍ය දේපල නිසා නීතිමය චෝදනා එන තත්වයක්. අදාල රථය විතරක් නෙමේ සභාවත් ගිනිගන්න තිබුනා.යම් අභ්‍යන්තර උවමනා තියෙන බවයි මතය.මේ ගැන විධිමත් පරික්ෂන කරන්න.ජාතික අපරාධ.අදාල රැකියා වල වගකිම් තියෙනවා.දරලා නෑ.පුද්ගලික අමනාප .මේ අයට වගකීමෙන් නිදහස් වෙන්න බෑ.සී.සී.ටි.වී.කැමරා සවි කලාම නිවැරදිව යාවත්කාලින කරන්න.මේවැනි වගකිමක් නැති රාජය සේවකයින් සභාවල තියන්න එපා.නිතිමය පියවර නිසි පරිදි ගන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා :-

සබාවේ දේපල විනාශ කිරිම තරයේ හෙලා දකිනවා.එදා රෑ සිදුවිම නිසි ක්‍රියාමාර්ග නිතිමය පියවර ගන්න.මුරකරු දැකලත්නෑ.පොලිසිය ඇවිත් තියෙන්නේ පිච්චෙන හඳට.ලබන සභාවට පරික්ෂන වල තිරන කියන්න.ඉන්ෂුවරන්ස් හම්බුවෙයිද?දේශපාලන කඩාකප්පල් ක්‍රියාවලට දෙන වන්දි පිලිබඳ ඉල්ලිම් වලට දාන්න.මටත් පාඩුයි.ලක්ෂ 4 ක් විතර.මේ විනාශය සබාවට කලේ නිසි දඩුවම් දෙන්න.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා -

තුන්දෙනෙක් අල්ලලා.වරද පිලි අරන්.අධිකරනය තීන්දුව දෙයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-

මේ සිදුවිම සම්බන්ධව දුරකතනයෙන් කතා කලා.හමුදාවට කතා කලා.ආරක්ෂාවට කට්ටිය යෙදෙව්වා.ලේකම්තුමිය කෑම ගෙනාව.අනාරක්ෂිත තත්වය නැති කලා.උප සභාපතිතුමා කතා කලා.ඒ අවස්ථාවේ කලයුතු දේවල් කලා.සෝමරත්න මන්ත්‍රිතුමත් ගියා.බිමත්ව හිටියා කීවට බෑ. නිසි පියවර ගන්න.යුධ හමුදාවට ,පොලිසියට, උපසභාපතිතුමාට ,ලේකම්තුමියට ස්තුති කල යුතුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා :-

පෙර දිනයේ පොඩි උද්ගෝෂනයක් තිබිලා.මම මෙතනට ආවා.මුරකරු හිටියා.මම කීවා මේ අවස්ථාවේ දැඩි අවධානයෙන් ඉන්න කියලා.නමුත් එසේ වෙලා නෑ. මේක ලඝු කර සිතන්න එපා.තව දුරටත් පැතුරුනානම් මේ සභාවත් ගිනි ගන්නවා.මේ ස්ථානයට සැබවින්ම ආදරෙයි.නිසි පියවර ගන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විකසිත පුෂ්පකුමාර මහතා :-

මේ සිසිටිවි කලින්ම දාලා තිබුනානම් ඉතා වැදගත්.දැන් උනත් දැම්ම වැදගත්.මේ ගිනිගැනිම් ඉබේ නොවුන බව ප්‍රකාශ උනා.එසේම තෙල් අදිනවා කීවා.ඒක සිසිටිවි වලින් අල්ලන්න බැරිවෙයි.පිටදි අදින්න පුළුවන්.තෙල් පිලිබඳ අවධානයෙන් ඉන්න.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා -

පොලිසිය මේ පිලිබඳ කරුනු සොයාගෙන අත් අඩංගුවට ගත්තා.ගිනිගන්න හේතුවක් නෑ.යම් සම්බන්ධයක් ඇති අය පොලිසිය සොයාගත්තා.ගරු උප සභාපතිතුමා පොලිසිය හමුදාව සියව දෙනාට ස්තුතියි මේ තැන ට ආරක්ෂාව සැපයීම ගැන.පැට්‍රල් ඇදීම, ත්‍රී විල් එකට ගැහුවට නෑ. ගාන අයකරගත්තා මුරකරුවන්ගෙන්.වාහන ගිනි තැබීමෙන් සභාවම ගිනිගන්න තිබුනා.වැස්ස නිසා ප්‍රමාද වෙලා.මුරකරුවා නිදි.පොලිසිය ගඳට ඇවිත්.උපදෙස් දීපු අයත් ඇති.පිලිඅරන්

**තියෙන්නේ.සේවය පැහැර අරින අයනැවත සේවයට ගන්න එපා. සියළු නීතිමය කටයුතු කෙරෙනවා.පරික්ෂන කලාම තින්දුව අනුව කටයුතු කරමු.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩිලාන් දර්ශන රණසිංහ මහතා :-</u>

**කාර්මික නිලධාරි න් සොයා බලන්න සවි කල යුතු තැන්.නිශ්වය කරගන්න. පොඩි සැලසුමක් හදල ආයතනයට දෙමු.පද්ධතිය ගැන.අපිට අවශ්‍ය විධිහට පිරිවිතර දාමු. මිල ගනන් එන්නේ එක එක විධිහට.අත්‍යවශ්‍ය ගේට්ටු,ආදිය ඇතුලත් කරමු.සබා භූමියෙත් සැලසුම දෙන්න.නිසි පරිදි සුදුසු ලෙස මිල ගනන් කැඳවන්න.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශිය සභා ප්‍රධාන කාර්යාලයේ හා කාර්යාල පරිශ්‍රයේ ( පුස්තකාලයද ඇතුලත්ව)අත්‍යවශ්‍ය ස්ථානවලට අවම ප්‍රමානයෙන් සිසීටිවි කැමරා සවි කිරීමටත් මිලදී ගැනීම කටයුතු** ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගෙන සිදුකිරීමටත් **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

## <u>2022.05.20 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක 05-16 හි උදෘතය</u>

**05-16.ප්‍රාදේශිය සභා එල්ලාවල උප කාර්යාලයට අයත් වරිපනම් විරෝධතා තීරන දැනුම් දිම සම්බන්ධ යෝජනාව.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා -</u>

**2021.10.21 හා 2022.10.22 දෙදින පවත්වන ලද තක්සේරු විරෝධතා පරීක්ෂනය අනුව ලබාදුන් තීරන අනුව එල්ලාවල උප කාර්යාලයට අයත් වරිපනම් සිමාවේ ඇති ඉවත්කරන ලද දේපල වලට අදාලව 2022.03.31 දින දක්වා හිඟ ශේෂයන් පහත දක්වා ඇති අතර එමරු.17067.14 ක මුදල කපා හැරිමට යෝජනා කරමි.මෙම ඒකකමීටර් 150 ට දුරින් වැඩි වන ලෙස පිහිටා ඇත.**

| අනු අංකය | වරිපනම් අංකය | අයිතිකරු | දේපල විස්තරය | වාර්ෂික වටිනාකම (රු.) | 2022.03.31 දිනට හිඟ මුදල (රු.) |
|---|---|---|---|---|---|
| 1 | 8 | එම්.පී.සේනානායක | ඇස්බැස්ටස් ,කොන්ක්‍රීට් සහ රට උළු සෙවිලි දෙමහල් නිවස | 48113.00 | 0.00 |
| 2 | 874/13 | ජේ.ඩී.රංජිත් ලාල් සමරවීර | ඇස්බැස්ටස් සෙවිලි නිවස | 6,736.00 | 1334.09 |
| 3 | 948/5 | කුලවංශ | ඇස්බැස්ටස් සෙවිලි නිවස | 16,258.00 | 3238.86 |
| 4 | 1859/25 | ඒ.ඩී.කේ.චරිත කුලරත්න | උළු සෙවිලි නිවස | 53,887.00 | 10588.73 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 5 | 1108/19 | බී.එල් ගුණරත්න බෝගහපිටිය | ඇස්බැස්ටස් සෙවිලි නිවස | 7,698.00 | 1524.40 |
| 6 | 1859/29 | අයිතිකරු | තේ ඉඩම | 1925.00 | 381.06 |
| | | | | එකතුව | 17067.14 |

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා :-</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-</u>

**වරිපනම් වල නම ලියන්න. හි.කි.ලෙස දාන්න එපා.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව අනුව 2021.10.21 හා 2022.10.22 දෙදින පවත්වන ලද තක්සේරු විරෝධතා පරීක්ෂනය අනුව ලබාදුන් තීරන අනුව එල්ලාවල උප කාර්යාලයට අයත් වරිපනම් සීමාවේ ඇති ඉවත්කරන ලද දේපල වලට අදාලව 2022.03.31 දින දක්වා හිඟ ශේෂයන් ඉහත දක්වා ඇති අතර එහි සදහන් පරිදි රු.17067.14 ක මුදල කපා හැරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**2022.05.20 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක 05-16 හි සත්‍ය උදෘතයක් බවට සහතික කරමි.**

**එස්.එච්.ආර්.වීරක්කොඩි,**
**ලේකම්,**
**ප්‍රාදේශීය සභාව,කුරුවිට.**

<u>**2020.05.20 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක 05-17 හි උද්‍ධෘතය**</u>

**05-17. හිඟ වරිපනම් බදු එකතුකිරිම සඳහා කොමිස් මුදල ලබාගැනිම -සභා තීරනය සංශෝධනය කිරිම සම්බන්ධ යෝජනාව.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා -</u>

**5/10/2017 චක්‍ර ලේඛය අනුව2021/2022 හිඟ වරිපනම් බදු එකතුකිරිම සඳහා කොමිස් මුදල ලබාගැනිම සම්බන්ධයෙන් බදු එකතු කිරීමේ නිලධාරින්ට 10% ක කොමිස් මුදලක් ලබා දිමට 2021.12.10 දින මහා සභා තීරනයක් ලබා ගත් අතර එය 9.9% කොමිස් මුදලක් ලෙස නිවැරදි විය යුතු බවට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා :-</u>
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව අනුව 5/10/2017 චක්‍ර ලේඛය අනුව 2021/2022 හිඟ වරිපනම් බදු එකතුකිරිම සඳහා කොමිස් මුදල ලබාගැනිම සම්බන්ධයෙන් බදු එකතු කිරීමේ නිලධාරින්ට 10% ක කොමිස් මුදලක් ලබා දිමට 2021.12.10 දින මහා සභා තීරනයක් ලබා ගත් අතර එය 9.9% කොමිස් මුදලක් ලෙස නිවැරදි විය යුතු බවට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

**2020.05.20 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක 05-17 හි සත්‍ය උද්‍ධෘතයක් බවට සහතික කරමි.**

**එස්.එච්.ආර්.වීරක්කොඩි,**
**ලේකම්,**
**ප්‍රාදේශීය සභාව,**
**කුරුවිට.**

## 2020.05.20 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක 05-18 හි උද්‍ධෘතය

**05-18.** මිල්ලවිටිය ශ්‍රී විද්‍යාවර්ධන පිරිවෙන ඉදිරිපිටින් ගලාබසින ඇළමාර්ගය වර්ෂා කාලයේ අක්‍රමවත්ව ගලා බැසීම හේතුවෙන් විහාරයේ ඉඩම බාදනය වීම වැලැක්වීමට හියුම් පයිප්ප ලබාගැනීම සම්බන්ධ ව අති පූජ්‍ය මඩලගම වජිරබුද්ධි මහා නායක ස්ථවිර වහන්සේ විසින් යොමු කර ඇති ඉල්ලීම සම්බන්ධ යෝජනාව.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා -</u>

මිල්ලවිටිය ශ්‍රී විද්‍යාවර්ධන පිරිවෙන ඉදිරිපිටින් ගලාබසින ඇළමාර්ගය වර්ෂා කාලයේ අක්‍රමවත්ව ගලා බැසීම හේතුවෙන් විහාරයේ ඉඩම බාදනය වීම වැලැක්වීමට හියුම් පයිප්ප ලබාගැනීම සම්බන්ධ ව අති පූජ්‍ය මඩලගම වජිරබුද්ධි මහා නායක ස්ථවිර වහන්සේ විසින් ඉල්ලීමක් සිදු කර ඇත.

**ඒ අනුව මිල්ලවිටිය ශ්‍රී විද්‍යාවර්ධන පිරිවෙන ඉදිරිපිටින් ගලාබසින ඇළමාර්ගය වර්ෂා කාලයේ අක්‍රමවත්ව ගලා බැසීම හේතුවෙන් විහාරයේ ඉඩම ඛාදනය වීම වැලැක්වීමට හියුම් පයිප්ප ලබාගැනීම සම්බන්ධ ව අති පූජ්‍ය මඩලගම වජිරබුද්ධි මහා නායක ස්ථවිර වහන්සේ විසින් සිදුකර ඇති ඉල්ලීම පරිදි කාර්මික නිලධාරි වාර්තාවක් ලබාගෙන ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගෙන අවශ්‍ය හියුම් පයිප්ප ලබා දිමට යෝජනා කරමි.**

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී** ඩිලාන් දර්ශන මහතා **:-**</u>

එම යෝජනාව ස්ථිර කරමි.

**මහවත්ත සිට එන ජල ප්‍රවාහය හීන් ඇලට වැටෙනවා.මේ පැත්තම යටවෙලා තෙත් වෙලා පන්සල් ඉඩම ඛාදනයට පත් වෙනවා.අවශ්‍ය අනුමැතින් ලබාගෙන දෙමු.ඉතා වටින කාර්ය භාරයක්.**

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී** මානෙල් කරදන මිය **:-**</u>

**වැහි කාලෙට විශාල ජල ප්‍රවාහයක්.පරිසර හානියක්.මගේ ඉඩමත් සෝදාපාළුවට ලක්වුනා.අදාල කටයුත්ත කර දෙන්න.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව අනුව හා මිල්ලවිටිය ශ්‍රී විද්‍යාවර්ධන පිරිවෙන ඉදිරිපිටින් ගලාබසින ඇළමාර්ගය වර්ෂා කාලයේ අක්‍රමවත්ව ගලා බැසීම හේතුවෙන් විහාරයේ ඉඩම ඛාදනය වීම වැලැක්වීමට හියුම් පයිප්ප ලබාගැනීම සම්බන්ධ ව අති පූජ්‍ය මඩලගම වජිරබුද්ධි මහා නායක ස්ථවිර වහන්සේ විසින් සිදුකර ඇති ඉල්ලීම සම්බන්ධයෙන් කාර්මික නිලධාරි වාර්තාවක් ලබාගෙන ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගෙන අවශ්‍ය හියුම් පයිප්ප ලබා දිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

**05-19.**

**කුරුවිට ප්‍රාදේශීය සභාවේ කම්කරු විවේකාගාරය සැකසීම කොන්ත්‍රාත්තුවේ වැඩ අවසන් විම හේතුවෙන් මුදල් ඉල්ලා සිටිම පිළිබඳ 158, පුස්සැල්ල ගොවි සංවිධානය විසින් ඉදිරිපත් කර ඇති ඉල්ලීම සම්බන්ධ යෝජනාව.(පසුගිය සභාවේ තීරන අංක 05-25 යටතේ සභා අනුමැතිය ලැබී ඇති අතර එය න්‍යාය පත්‍රයේ ඇතුලත් කර නීත්‍යානුකූල කිරීම)**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා -</u>

මෙම යෝජනාව පසුගිය සබාවට ඉදිරිපත් කලද එය න්‍යායපත්‍රයේ ඇතුලත්ව නොමැති බැවින් නිත්‍යානුකූල කිරිම සඳහා නැවත ඉදිරිපත් කරන ලදි.ඒ අනුව

පුස්සැල්ල ගොවිසංවිධානෙන්ඉල්ලිමක් කල අතර 158 - පුස්සැල්ල ගොවි සංවිධානය මගින් ලබාගන්නා ලද කුරුවිට ප්‍රාදේශීය සබාවේ කම්කරුවන් සඳහා වූ විවේකාගාරයක් ඉදිකිරිම වැඩ අවසන් කර දැනට මාස කිපයක කාලය ඉකුත්වි ඇති අතර මුදල් තවමත් නොලැබුන බවත් වවුචර් හා බිල්පත් අමාත්‍යංශයට යොමුකර ඇති බවත් ඒ අනුව කරන ලද ද්‍රව්‍ය හා සේවා කර්මාන්ත සම්බන්ධව.ගෙවිමට ඇති බැවින් අමාත්‍යංශයෙන් මුදල් ලැබුණ පසු ප්‍රතිපූර්නය කරන තෙක් කුරුවිට ප්‍රාදේශීය සභා අරමුදලින් මෙම මුදල ලබාදෙන ලෙස ඉල්ලා ඇත.ඒ අනුව 158 - පුස්සැල්ල ගොවි සංවිධානය මගින් ලබාගන්නා ලද කුරුවිට ප්‍රාෙද්ශීය සබාවේ කම්කරුවන් සඳහා වූ විවේකාගාරයක් ඉදිකිරිම වැඩ අවසන් කර දැනට මාස කීපයක කාලය ඉකුත්වි ඇති බැවින් හා මුදල් තවමත් නොලැබුන බැවින් හා කරන ලද ද්‍රව්‍ය හා සේවා කර්මාන්ත සම්බන්ධව ගෙවිමට ඇති බැවින් අමාත්‍යංශයෙන් මුදල් ලැබුණ පසු ප්‍රතිපූර්නය කරන තෙක් පුස්සැල්ල ගොවි සංවිධානය වෙත ගෙවිය යුතු මුදල කුරුවිට ප්‍රාදේශීය සභා අරමුදලින් නීත්‍යානුකූලව ගෙවීම් කිරීමටත් ,මෙම ගෙවීම සභා ආදායම් තත්වය යහපත් වූ පසුව සිදු කිරිමටත් යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා :-</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා :-</u>

**පවතින ආර්ථිකය සමග මේ ගෙවිම් ගැටළුවක් වෙයිද?**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-</u>

**සභාව තීන්දුවක් අරන් තියෙනවා.හතරක් ,පහක් පමන ගෙවන්න ඇති.සබා ගිවිසුම් අත්සන් කරලා.වැඩ කල මිනිස්සු අමාරුවේ දාන්න බෑ.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා -</u>

**මුදල් තියෙන පිලිවෙලට ගෙවමු.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩිලාන් දර්ශන රණසිංහ මහතා :-</u>

**මුලින්ම මුදල් අමාත්‍යාංශෙ ලිපිය ගෙන්වාගන්න.ගෙවනවා කියලා.අමාත්‍යාංශෙන් නිශ්චිතව ලැබෙනවද?ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් දැන් ගෙවීම් කරන්නෑ.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා.</u>

**ගමේ මන්ත්‍රී ලෙස සමිතියට අපි බැඳිලා.ගිවිසුම් අත්සන් කරලා ,වැඩ කරලා ,මුදල් ගැටළු ආවාම ගමේ මන්ත්‍රී ලෙස අපටයි කියන්නේ.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව අනුව හා 158 - පුස්සැල්ල ගොවි සංවිධානයේ ඉල්ලිම් අනුව ලද කුරුවිට ප්‍රාදේශීය සභාවේ වේ කම්කරුවන් සඳහා වූ විවේකාගාරයක් ඉදිකිරිම වැඩ අවසන් කර දැනට මාස කීපයක කාලය ඉකුත්වි ඇති බැවින් හා මුදල් තවමත් නොලැබුන බැවින් හා කරන ලද ද්‍රව්‍ය හා සේවා කර්මාන්ත සම්බන්ධව ගෙවිමට ඇති බැවින්, අමාත්‍යාංශයෙන් මුදල් ලැබුණ පසු ප්‍රතිපූර්නය කරන තෙක්, පුස්සැල්ල ගොවි සංවිධානය වෙත ගෙවිය යුතු මුදල කුරුවිට ප්‍රාදේශීය සභා අරමුදලින් නීත්‍යානුකූලව ගෙවීම් කිරීමටත් ,මෙම ගෙවීම් කටයුතු සභා ආදායම් තත්වය යහපත් වූ පසුව සිදු කිරිමටත් ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

<u>**2020.05.20 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක 05-20 හි උද්‍ධෘතය**</u>

**05-20.** කුරුවිට ප්‍රාදේශීය සභාවේ කාර්මික කමිටුවට නව සාමාජිකයින් පත්කරගැනිම සම්බන්ධ යෝජනාව.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා -</u>

**මේ සම්බන්ධව පසුගිය සභාවේදි කතා කලා.නමුත් න්‍යායපත්‍රයේ නොමැති නිසා නැවත ඉදිරිපත් කලා.**

**ඒ අනුව 2021.12.10 දින කුරුවිට ප්‍රාදේශිය සභාවේ කාර්මික කමිටුවට සාමාජිකයන් පත් කලත් මේ වෙන විට විවිධ අපහසුතා හේතුවෙන් ඇතැම් සාමාජිකයන්ට සහභාගි විමට නොහැකි බව දන්වා ඇති නිසා,ගරු මංගල ඩයස් මන්ත්‍රි තුමා පැමිනිමට අපහසුතා ඇති බව දැනුම් දුන්නා.ගරු රත්නසිරි මන්ත්‍රිතුමා අසනීප නිසාද ගරු ශානක දර්ශන මන්ත්‍රිතුමා රැකියාවේ කටයුතු නිසා අපහසු විමද නිසා ඒඅය වෙනුවට නව සාමාජිකයන් පත්කර ගැනිම සුදුසු වන බැවින් නව සාමාජිකයන් ලෙස ගරු කැළුම් ශ්‍රී ධර්මදාස මහතා,ගරු රංජිත් මෙන්ඩිස් මන්ත්‍රිතුමා පත් කර ගැනීම සුදුසු වේ.**
**ඒ අනුව කාර්මික කමිටුවට දැනට සිටින සාමාජිකයන් වන සභාපති ලෙස මාද ඇතුළුව ගරු ප්‍රාසම රංජන් ප්‍රදීප් මහතා, ගරු ප්‍රාසම මහින්ද විජේකුමාර මහතා, ගරු ප්‍රාසම තරංග නිල්මිණි මහතා, ගරු ප්‍රාසම ඩබ්.කේ.තිලකාවතී මිය ,ලේකම් තුමිය සමග නව සාමාජිකයින් ලෙස ගරු කැළුම් ශ්‍රී ධර්මදාස මහතා,ගරු රංජිත් මෙන්ඩිස් මන්ත්‍රිතුමා පත් කිරිම සුදුසු බවට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා :-</u>
එම යෝජනාව ස්ථිර කරමි.
ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව අනුව කාර්මික කමිටුවට දැනට සිටින සාමාජිකයන් වන ගරු සභාපති තුමා, ගරු ප්‍රාසම රංජන් ප්‍රදීප් මහතා, ගරු ප්‍රාසම මහින්ද විජේකුමාර මහතා, ගරු ප්‍රාසම තරංග නිල්මිණි මහතා, ගරු ප්‍රාසම ඩබ්.කේ.තිලකාවතී මිය ,ලේකම් එස්.එච්.ආර්.වීරක්කොඩි මිය සමග නව සාමාජිකයින් ලෙස ගරු කැළුම් ශ්‍රී ධර්මදාස මහතා,ගරු රංජිත් මෙන්ඩිස් මන්ත්‍රිතුමා පත් කිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**2020.05.20 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක 05-20 හි සත්‍ය උද්ධෘතයක් බවට සහතික කරමි.**

**එස්.එච්.ආර්.වීරක්කොඩි,**
**ලේකම්,**
**ප්‍රාදේශීය සභාව,**
**කුරුවිට.**

**2022.05.20 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක 05-21හි උදෘතය**

## 05-21. ඇස්තමේන්තු

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා**

05-24-01 සිට 05-21.02- දක්වා පහත ඇස්තමේන්තු අනුමත කිරිමට යෝජනා කරමි,සබාවේ බුදුමැදුර සම්බන්ධව දැනට කර්මාන්තය කරගෙන යාමේදි ඉදිකිරිම් ද්‍රව්‍ය හිග තාවයක් නිසා විශේෂ ගාස්තු උපලේඛන යටතේ ඉදිකිරිමට ඇති අයිතම වල එනම් සුදු යකඩ විදුරු රාමුව සහිත විදුරු ආවරනය,සුදු යකඩ රාමුව සහිත කණු,සුදු යකඩ රාමුව සහිත වහලය ආදි අයිතම ඉටු කිරීමේදි මිල වැඩිවිමක් සිදු වුනා.මුල් ඇස්තමේන්තු මුදල වන 970953.33 ක මුදල **රු.1381544.84 ලෙස සංශෝධනය කල යුතු වෙනවා. .**

**05-21-01.ගංවතුර හේතුවෙන් ජන ජීවිතයට සිදුවන පීඩාව වැලැක්වීම සඳහා වලව්වත්තේ සිට ගොඩපරගහ ඇල කපා පලල් කර සංවර්ධනය කිරිම.රු. 700000.00**

**05-21-02.කුරුවිට ප්‍රාදේශිය සභාවේ බුදු මැදුර ඉදිකිරිම. ( සංශෝධන) රු.1381544.84**

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා :-**

එම යෝජනාව ස්ථිර කරමි.මේ වෙලාවේ ගෙවිම් වලට කලබල වෙන්න එපා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-**

සමිති ගාස්තු 15% අඩු කරන්න.උදව් කරන අයත් ඉන්නවානේ.මේ මුදල් ගෙවන්න පෙර සභාවට දාන්න.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා**

ගරු ධනවර්ධන මන්ත්‍රිතුමා ලක්ෂ 2 ½ ක බුදු පිළිමය දෙනවා. ඒකට ඔඩරය දෙන්න ඕනි.ප්ලාස්ටර් ඔප් පැරිස් පිළිමයක් දැනට මෙතන තියනවා.අර පිළිමය ලැබුනාම මේ පිළිමය උප

කාර්යාලයට දෙනවා.එසේම ගිවිසුම් අත්සන් කරලා.සබාවේ මුදල් තත්වය යහපත් වුවිට ගෙවනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්. ජයරත්න</u>** <u>මහතා</u> **<u>:-</u>**

බුදු මැදුරට අපිට ගෙවීම් කරන්න බැ.පනත අනුව බැ.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල** මහතා **ගේ යෝජනාව අනුව** 05-21-1 සිට 05-21-02 දක්වා ඉහත ඇස්තමේන්තු අනුමත **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

**2022.05.20** දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක **05-21හි සත්‍ය උද්‍ධෘතයක් බවට සහතික කරමි.**

**එස්.එච්.ආර්.වීරක්කොඩි,**
**ලේකම්,**
**ප්‍රාදේශීය සභාව,**
**කුරුවිට.**

05-22. නව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා බොරලැස්සවත්ත ඉඩමේ කොටසක් අත්කර ගැනිම සම්බන්ධ යෝජනාව.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා -
නව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා බොරලැස්සවත්ත ඉඩමේ කොටසක් අත්කර ගැනීම සම්බන්ධව ප්‍රාදේශීය ලේකම් , කිරිඇල්ල විසින් ලිපියක් යොමු කර ඇත.ඒ අනුව දැනට පවතින කාර්යාල ගොඩනැගිල්ල පිහිටි ඉඩම අවධානම් තත්වයේ පවතින බැවින් වෙනත් ස්ථානයකට ගෙන යාම අවශ්‍ය බවත් ඒ සඳහා බොරලැස්සවත්ත ඉඩමින් අක්කර 1.5ක් පමණ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට අත්කර ගැනීම සඳහා මේ සමඟ යොමු කර ඇති දළ සැළැස්ම පරිදි සභාවේ එකඟතාවය ලබාදෙන ලෙස ඉල්ලා ඇත.මේ ඉඩම සභා ඉඩමක් නොවේ.කාර්මික නිලධාරි වාර්තාව ද ලබා ගෙන ඇත. ඒ අනුව කිරිඇල්ල නව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා බොරලැස්සවත්ත ඉඩමේ කොටසක් අත්කර ගැනීම සම්බන්ධව මහා සභාවේ එකඟත්වය ලබාදීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා :-
එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා .
සංස්කෘතික මධ්‍යස්ථානය පිහිටි අපේ ඉඩම කුරුවිට ප්‍රාදේශීය ලේකම්ගෙන් ගැනීමට අපි කටයුතු කලා. ඒවායේ ඉදිරි පියවර ගත්තේ නෑ . කඩිකම් කරන්න .ළමා මධ්‍යස්ථානයක් පිහිටුවනවා. පුස්තකාලේ වැඩක් නැතිව යනවා.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා -

නඩු කියන්න බෑ සාකච්ඡා කරලා විසඳමු .දිලිනි මැඩම් ඉන්න කාලේ එතන ඕනි නෑ කීවා.නැවත ඉල්ලමු. දැනුම් දෙමු.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා :-
නැවත දැනුම් දෙන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉන්ද්‍රානි වික්‍රමසිංහ මිය.
කඳන්ගොඩ සුසාන භූමිය නඩු තීන්දුව ලැබුනා .වෙන් කරලා දෙන්න .

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව අනුව හා කිරිඇල්ල** ප්‍රාදේශිය ලේකම් ගේ ඉල්ලීම් ලිපිය අනුව කිරිඇල්ල නව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය සඳහා බොරලැස්සවත්ත ඉඩමේ කොටසක් අත්කර ගැනීම සම්බන්ධව මහා සභාවේ එකඟත්වය ලබාදීමට**ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

## 06.කාරක සභාවල වාර්තා

### කාරක සභාවල වාර්තා

06-01 මුදල් කමිටු වාර්තාව(2022.05.09 )

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**

22.05.09 දින **මුදල් කමිටු වාර්තාව** සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීමට හා එහි සඳහන් නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සුදුසු බවටත් **මහා** සභා අනුමැතිය ලබා දිමට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධනවර්ධන මහතා :-**

එම යෝජනාව ස්ථිර කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩිලාන් දර්ශන මහතා :-**

කමිටු වාර්තාවේ අංක 64 දෝෂ සහිත වේ.මෙම මිලදි ගැනීම සම්බන්ධව කරුණු නැවත නිවැරදි විය යුතුයි. සියළු කරුණු දෝෂ සහිත වේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ.කුලරත්න මහතා :-**

අංක 64 යටතේ මුද්‍රන දෝෂ මත වැරදි සිදුවී ඇත.නිවැරදි කරන්න.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**

මෙම ත්‍රි රෝද රථයට ටයර් ගැනීමට මිල කැදෙව්වද මිල ගනන් ලැබී නොමැත.නැවත මිල ගනන් කැඳවිම අවශ්‍ය වෙ. ට්‍රැක්ටර් රථය සඳහා ටයර් වලට මිල ගනන් ලැබී තිබුනද ඒවා මෙහි මුද්‍රණ දෝෂ සහිත වේ. මෙම මිල ගනන් නැවත ත්‍රි රෝද රථයට සමග කැදවා මුදල් කමිටුවට ඉදිරිපත් කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රන්ජන් ප්‍රදීප් මහතා :-**

සංශෝධනය කරන්න.කාර්මික කමිටු නිර්දේශ ලබා දි ඇති ඒවා ඒ නිර්දේශ සමග දමන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-**

මේ පරන ට්‍රැක්ටර් වල කැඩෙන කැලි නෑ.පරන ට්‍රැක්ටර් හොඳට දුවන්න පුළුවන්. හදලා ඉවරයි.පරන කැලි දැන් නැතිවත් ඇති.ඒවට යමක් කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා :-**

වාහන කලමනාකරනය කරන්න.කැලි මෙහේ තියෙන්න ඕනි.මේ පැච් දැම්මට දිගටම මේවා සොයා බලන්න.හේතුව සොයන්න.පැච් කොපමන දාලා තියේද බලන්න. ටියුබ් ගලවලා බලමු පැච් ඇත්තටම දාලද කියලා.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**

දුවන කොටයි පැච් යන්නේ. ඒ අවස්ථාවේ දැම්මේ නැත්නම් වැඩ කරන්න බෑ.බිලත් ගේනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ.කුලරත්න මහතා :-**

ඒ වැනි අවස්ථාවක කාර්මික නිලධාරි යවන්න.පරීක්ෂා කර බලවන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-**

මේ කාර්මික කටයුතු වලට පිරිමි නිලධාරියෙකු යොදවන්න. ටයර් වල පැච් ලේසියෙන් යන්නේ නෑ.එසේම පෙරෙට්ටුව තියන්න ඕනි.යාමට පෙර වාහනය පරීක්ෂා කල යුතුයි. කිසිවක් සිදුවන්නේ නෑ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩිලාන් දර්ශන මහතා :-**

**වාහනයේ පොතතියෙනවා.එහි සියල්ල සඳහන් විය යුතුයි.ටියුබ් දාපු දිනය තියෙනවා.ඒ පොත අනුව සියල්ල නිවැරදිව කල හැකියි.**

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**

**උදේ 5.00 ට එන්නේ.උදේට නිලධාරි ගෙන්වන්න බෑ. ක්‍රම වේදයක් හැදිය යුතුයි.මේ මිල ගනන නැවත කැඳවමු.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx** 2022.05.09 **වන දින මුදල් කමිටු වාර්තාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීමට ත් එහි සඳහන් නිර්දේශයන් ක්‍රියාත්ම කිරීමත් සුදුසු බවට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

06-02 කුඩානගර ජලසම්පාදනක්‍රමයේ විධායකකමිටු රැස්වීම් වාර්තාව.(22.04.05)

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>

**සබාවේ දැනුවත් වීම සඳහා ඉදිරිපත් කර ඇත.**

**<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා :-</u>**

**ආදායම වියදම ත් ලබා දෙන්න. කඩිනමින් ජල කටයුතු ඇමතිතුමා සමග කතා කරජල ව්‍යාපාති ගැටළු හා ජ ල සේවක ගැටළුත් විසඳන්න. ජල ව්‍යාපාතියේ වත්කම් මොකද කරන්නේ?තිරන ගන්න.ජල කමිටුවේත් අනවශ්‍ය වියදම් එපා.බෝනස් එපා.අතිරේක වියදම් එපා.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-</u>**

**කුඩා නගර ජල ප්‍රජා දායතක්වය දි ජලය ලබාගත් අයට ජලය ලබා දීමේදි ගාස්තු සම්බන්ධව සාකච්ඡාවක් තියන්න. සාප්පු පනතින් මෙ ව්‍යාපාතිය පාලනය වෙන්නේ.සේවකයන් ගැන තින්දු ගන්න.කමිටුවේ අනුමත කල රු.30000.00 නයක්ද?ඒ කමිටුවේ ගෙවීම් වාර්තා මෙතෙක් ලබාදි නෑ.ඒවාත් දෙන්න.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>

**එය සේවකයන් හට ලබාදුන් නයක්.**

**07 <u>ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ</u>**

**07-01** -2022 මාර්තු මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය/ලැබීම් සාරාංශය/ ආදායම් අයකිරීමේ ප්‍රගතිය

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-</u>

2022 මාර්තු මාසික ඒකාබද්ධ වැය සාරාංශය/ලැබීම් සාරාංශය/ ආදායම් අයකිරීමේ ප්‍රගතිය සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සඳහා යෝජනා කරමි.

**<u>ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිණී  දයා කස්තූරි මිය-</u>**

එම යෝජනාව ස්ථිර කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්. ජයරත්න මහතා :-</u>**

මූල ධන ලැබ් සම්බන්දව සාකච්ඡා කොට ගැටළු විසඳා ගත් අතර හිඟ මුදල් කඩිනමින් අය කරගැනිමට කටයුතු කරන ලෙසත් එය දැඩි අවශ්‍යතාවක් බවත් අවධාරනය කරන ලදී.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx**2022 මාර්තු **මස ඒකාබද්ධ ලැබීම් සාරාංශය, ආදායම් ඇස්තමේන්තුව,ඒකාබද්ධ වැය සාරාංශය, වියදම් ඇස්තමේන්තුව, ආදායම් අයකිරීමේ ප්‍රගති වාර්තාව ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

07-02 20022.05.05 දිනට කුරුවිට ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්වය.

**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-</u>**
මෙය සභාව දැනුවත් කිරිම සඳහා ඉදිරිපත් කරන ලදී.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-</u>**

නය හිමි වාර්තාවක් ලබා දෙන්න.

**<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා :-</u>**

අපි විවිධ පරිපූරක අනුමත කලා.උසාවි මුද්දර ගාස්තු,දඩ මුදල් ඉඩම් වෙන්දේසි ගාස්තු අපේ ආදායම්. අවධානය යෝමු කරන්න. අපි කීප වතාවක් කිරිඇල්ලට මුදල් වෙන් කලා.අනුමත කලා.ඒ මුදල් ගෙව්වේ නැත්තේ ඇයි? ඒ මුදල් කෝ?.මුදල් අනුමත කලා.නිර්දේශ දුන්නා.සංශෝධන කලා. ඒ මුදල් කෝ.ගැටළුවක්. ආදායම දෙකෝටි තිස් පන් ලක්ෂයයි.පළාත් සබාවෙන් ප්‍රතිපූර්නය නොකලොත් සභාවෙන් පඩි ගෙවන්න ඕනි.ලක්ෂ 40 ක අවධානම තියෙනවා. මෙතුවක් කල් අනුමත කලා. සංවර්ධන වැඩ.කොම්පෝස්ට්,කිරිඇල්ල, සම්මන්ත්‍රනශාලාව,නැවත ගෙවන්න තියෙනවළු.මුදල් මොකද වුනෙ?

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල  මහතා:-

මේ සියළු මුදල් ගරු මන්ත්‍රි තුමන්ලාගේ සංවර්ධන වැඩ වලටයි වැය උනේ. සම්මන්ත්‍රන ශාලාව සඳහා මුදල් ස්ථිර තුන්පතුවේ තියෙනවා.කිරිඇල්ල කඩ දිලා අය කරගෙන ගෙවන්නේ.මුදල් වෙන්කර තියලා නෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී  ඩිලාන් දර්ශන මහතා :-

යම් පුද්ගලයෙකු ගිවිසුමට එද්දි කාල රාමුවක් තියෙනවා.නිශ්චිත කාලයක් තියෙනවා.මිලියන ගානක් තිබුනට සංවර්ධනයට ගන්නේ ඒ මුදල්.මීට පෙර මේ සම්බන්ධව වාර්තා කරන්න තිබුනා.ඒ නොකල වරදයි මේ.ඉදිරිපත් කලා නම් අපිට ප්‍රමුඛතා ගත කරලා කරන්න තිබුනා.
එසේම කිසි විට දැනුම් දුන්නේ නෑ මේ තත්වය උදාවෙන බව .ගොඩනැගිල්ල හදලා.නමුත් නිමවුම නෑ.රටේ උනත් කලින් සිතුවේ නෑ මේ තත්වයට යයි කියලා.ආයතනයක ගෙදරක උනත් මේක වෙන්න පුළුවන්.මේ තත්වය දැනුවත් උනානම් වලකා ගන්න තිබුනා.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා :-

පරිපූරක ආදිය අනුමත කල පරිදි නෙවේද වියදම් කලේ.?පරිපූරක වෙන් කල කර්මාන්ත මොනවාද?

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල  මහතා:-

පරිපූරකය දානවිට ගිනුමේ තියෙන මුදල පිලිබඳව කියනවා.ඒ ගිනුමෙන් තමා කම්කරු වැටුප් ගෙවන්නෙත්.මේ තත්වය තව මාස 3 ක් තුල හරි යනවා.කිරිඇල්ල කඩ වෙන්දේසි කරලා ගෙවනවා. එය සභා මුදලට බරක් නොවේ.සම්මන්ත්‍රන ශාලාවට මුදල් තියෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී  ජී.එම්. ජයරත්න මහතා :-

ඩිලාන් මන්ත්‍රි තුමා කියන්නේ හෘර්ධ සාක්ෂියට එකගව.විගනන වාර්තා ඉදිරිපත් කරන්නේ නම් මේ දේ දැන ගන්න තිබුනා.මුදලක් වෙන් කලා නම් ඒ මුදල තියෙන්න ඕනි.මම ගිය වර අය වැය යෝජනා වලට මේ ගැටළු වලට විසඳුම් දෙන යෝජනා කලා.නමුත් එදා ඉදිරිපත් කලේ නෑ.
මම කීවා ආදායම් ලාබෙන වියදම් කරන ක්‍රමය.ඒවා කලා නම් ආදායම් එනවා.වියදම් විතරයි දැන්.රටක ගෙදරක උනත් මෙහෙමයි.කනගාටුයි.නොගෙවා ඉන්නෙත් කොහොමද?දැන්වත් හිතන්න රටට උන දේ අපිට උනේ.වැඩි වියදම් නොකලා නම් හරි.විදි ලාම්පු වලට වියදම් කලේ පුළුවන් වෙලාවේ නෙවේ.පනත විතරක් නෙමේ. මුදල් රෙගුලාසිත් බලන්න.දිගු කලක් මම මෙක කිව්වා .

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී  ඩිලාන් දර්ශන මහතා

සම්මන්ත්‍රන ශාලාව ටෙන්ඩර් කරමු.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-

එය සාර්ථක වෙයි.

07-03 2022 අප්‍රියෙල් මස ගෙවීම් වාර්තාව

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-

2022 අප්‍රියෙල් මස ගෙවීම් වාර්තාව සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ණි ප්‍රේමා ගම්ලත් මිය :-

2022_අප්‍රියෙල් මස ගෙවීම් වාර්තාව සභා සම්මත කරන ලෙස යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා :-

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා :-

අංක 256 ටැක්ටර් රථයට අලුතින් ටයර් එකක් යෙදීමට රු.350.00 ක් වැයබර. මෙවා නිවැරදි විය යුතුයි.මුද්‍රන දෝෂ.

අංක 139,267,300,සාකච්ජා කොට විසඳා ගන්නා ලදි.එසේම 285 නිතිඥ ගාස්තු ගෙවීමේදි මාසිකව නඩු විස්තර සබාවට ගෙන්වා ගන්නා ලෙස සාකච්ජා විය.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx 2022 අප්‍රියෙල් මස ගෙවීම් වාර්තාව ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

08.වෙනත් කරුණු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-

පසුගිය සබාවේ විදිපහන් සම්බන්ධව සාම්පල් සභාවට ඉදිරිපත් කලේ නෑ.එය මිල කැඳවීමේ සදහන් නේද?ඒ සාම්පල් සභාවට එවලා නෑ.අනිත් ටෙන්ඩර් කරු ඒවා ඉදිරිපත් කරලා නෑ.කොන්දේසි කඩලා. එක ටෙන්ඩරයයි පිලි ගන්න පුළුවන්.අනෙක මේ මිල ගනන් මිට අඩුයි. මම කඩවලින් ඇහුවා.මම මෙම ගෙවීමට එකඟ නැත.සාම්පල් ඉදිරිපත් කිරිමත් අත්‍යවශයයි.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-**

මේ පිලිබඳ පරික්ෂනය කරන්න.එසේම මේ ආයතනයෙන් කියනවා නම් අපි නැවත අහමු.මේ දැන් ඇමතුමක් ගන්න. මෙය ගැටළුවක්.

මේ අවස්ථාවේදි **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි මංගල ඩයස් මහතා දුරකථනයේ ඇමතුමක පටිගත කිරිමක් ඉදිරිපත් කලද එය ගරු සභාපතිතුමා විසින් ප්‍රතික්ෂේප කල අතර එම අවස්ථාවේදීම ඇමතුමක් ලබා ගන්නා ලදි.ගරු දේවින්ද කුමාර මහතා විසින් ඇමතුම ගන්නා ලද අතර ඔරේන්ජ් 150 ලෙඩ් බල්බ් එකක් මාසෙකට පෙර රු.19000.00 කට තිබුනද පසුව 23000,ද මේ වනවිට රු.25000.00 පමන වන බවද දැනුම්දුනි.**

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-**

ගරු මන්ත්‍රිතුමාලට අවශය බව කී නිසයි ගෙනාවේ.දැන් එක එක ගැටළු.මෙතන 45 ක් ඉන්නවා.මංගල මන්ත්‍රි තුමාට අවශ්‍ය නම් පරික්ෂනය කරන්න.හිතන්නේ අඩු ගානේ බාල ඒවා කියලා.මේවා විදුලිය විසන්ධි කිරීම නැවැත්තුවාම සවි කරන්නයි ගෙනාවේ.චයිනීස් ඒවා තියෙනවා. බාල.ඒවා ජනතාවට පලක්නෑ.පාඩුයි.මේ 45 ඇත්ත දැන ගන්න ඕනි.මට හැල්ලු වෙන්න බෑ.මිල කැඳවීමේ ඔරේන්ජ් නම සඳහන්.මිල කැඳවීම් මා සභාගත කලා. ප්‍රමිතිය ඇති දේයි මිලදි ගන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි මංගල ඩයස් මහතා :-**

මම ඔරේන්ජ් කියලා නෙමේ ඇහුවේ.ඒ බව සඳහන් නොවුන නිසා ඇහුවේ නිකම්ම බල්බ්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි දිප්ති චන්දන මහතා :-**

ඔබතුමා මේ පිලිබද දැනුම් දෙන්න. ආයතනයට.එක එක කෙනාට වෙන වෙන මිල ගනන්.කියනවා.

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා :-**

මමත් අනුමත කලාට ගන්න හදිසි වෙන්න එපා කීවා.ඒ බව වාර්තාවේ සඳහන්. නමුත් මමත් හිතුවා ගමේ වෙන දේකට මේ මුදල් යෙදවිය හැකි බව.ගාන වැඩිවෙයි කියලයි මමත් හිතුවා. ඒත් ගන්න හදිසි වෙන්න එපා කියලා කීවේ මේ මුදල් දුෂ්කරතාව මත. මේවා ගැන බුද්ධියෙන් කටයුතු කරන්න.අපි මෙතනදි එක්ව කටයුතු කරමු.මේ දුෂ්කරතා වලට.මේ ලාම්පු ආපහු දෙන්න උනත් මාත් එකහයි.අපි නිවැරදිව කටයුතු කරමු. දැනට මේ විදිපහන් මොකුත්කරන්න එපා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි සම්පත් බොතේජු මහතා :-**

අද වන විට මේ මිල ගනන් ඉතා වැඩිවෙලා.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-**

විදුලිය නිසි පරිදි ලබාදෙන තුරු කිසිවක් කරන්නේ නෑ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා :-**

විවිධ වර්ගයේ විදිපහන් අලෙවියට තිබුනත් අපි මේ වගේ ආයතනයකට මිලදි ගන්නේ ප්‍රමිතියේ ඒවා. බාල ඒවා නොවේ.යම් විමසිමකදි දැනුවත්ව ඇසිය යුතුයි.

මේ අවස්ථාවේදි සභාවේ ගෝෂා පැවතිනි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩිලාන් දර්ශන මහතා :-**

මිල වැඩිවෙන නිසා ගත්තේ.සවි නොකර ඉමු.මේ දෝෂ සහිත තැන් නිවැරදි කරන්න.ගැටළු ඇතිවිය හැකියි.සාමාන්‍ය කෙනෙකුට තේරුම් ගත හැකි පරිදි මිල ගනන් ඉදිරිපත් කරන්න.එසේම මේ සංශෝධන ආදිය නිවැරදි කරන්න.මුදල් කමිටු වාර්තා ගෙවීම් වාර්තා කල් ඇතුව එවන්න. න්‍යායපත්‍රය සමග.එවිට ගැටළු නිවැරදි කරගත හැකියි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රන්ජන් ප්‍රදීප් මහතා :-**

ටයර් මිලදිගැනිම සම්බන්ධ නිවැරදි කරන්න.වාර්තා කලින් ලැබෙන්න සලස්වන්න.නිවැරදි කර ගත හැකියි.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-**

මෙවර මුදල් කමිටුව පසුවි තිබුනේ . මිට පසු නිසිපරිදි පවත්වා වාර්තාව කලින් ලැබිමට සැලසිය හැකියි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-**

වලදුරේ මිල්ලගහ කටයුතු කඩිනම් කරන්න.එසේම අනවසර දර ඇදීම සම්බන්ධව කාර්මික නිලධාරි යවන්න.

වෙනත් කරුනු-02

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-**

ජේ. කේ.එන්ට්‍රප්‍රයිසස් ආයතනය මගින් අප සභාවේ ආදාහනාගාරයට ලබාදෙන ගෑස් 37 .5 සිලින්ඩරයක් 2022.05.07 දින සිට රු.18413.00 ක් වන බව දන්වා ඇත. ඒ අනුව කටයුතු කරමු.

වෙනත් කරුනු-03

**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-</u>**

පසුගිය සභා වාරයකදි ගරු මංගල ඩයස් මන්ත්‍රීතුමා පෙන්වා දුන්නා ගොඩනැගිලි ඉදිකිරිම් හා පිඹුරු අනුමත කිරිම සම්බන්ධව කුරුවිට ප්‍රාදේශිය සභාව විසින් බස්නාහිර පළාතේ ක්‍රියාත්මක වන ,වැළඳගත් අතුරු ව්‍යවස්ථාව සම්බන්ධව.නමුත් ඒ සම්බන්ධව කිසිදු සටහනක් සොයාගත නොහැකි වුබව දැනුම් දි තියෙනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා :-</u>**

මේවා අනුමත කරලා ඉඩම් වෙන්දේසි කලා.
මේ විස්තර පළාත් සභා ප්‍රධාන ලේකම්ගෙතුමාගෙන් ගන්න.

## <u>2020.05.20 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ තීරන හදිසි යෝජනා අංක- 09- 01</u>

-09-හදිසි යෝජනා 01-

<u>2022 මැයි මස බදු මුදල් අයකිරිම සම්බන්ධව</u>

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-**

2022 මැයි මස බදු මුදල් අයකිරිම සම්බන්ධව.2022.මැයි 10 දින සිට 2022.05.12 දින පෙ.ව.07 දක්වා රටේ ඇඳිරි නීතියපනවා ඇති බැවින් ද 2022.05.12 දින පෙ.ව.2.00 සිට නැවත ඇදිරිනීතිය පැනවීමට නියමිත බැවින් 2022.මැයි මස බදු මුදල් අයකිරීමේදි ප්‍රමාද ගාස්තු මුදල් අය කිරිම සම්බන්ධව උපදෙස් පතා ඇති අතර ඒ අනුව2022.12,13 දෙදින බදු මුදල් අය කිරීමේදි දඩ මුදල් අය නොකිරිමට යෝජනා කරමි. මෙය හදිසි යෝජනා යටතේ ඉදිරිපත් කරමි.

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා**

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින් ඉදිරිපත් කරන ලද** හදිසි යෝජනා 01- අනුව 2022 මැයි මස බදු මුදල් අයකිරිම සම්බන්ධව.2022.මැයි 10 දින සිට 2022.05.12 දින පෙ.ව.07 දක්වා රටේ ඇඳිරි නීතියපනවා ඇති බැවින් ද 2022.05.12 දින පෙ.ව.2.00 සිට නැවත ඇදිරිනීතිය පැනවීමට නියමිත බැවින්ද 2022.මැයි මස බදු මුදල් අයකිරීමේදි ප්‍රමාද ගාස්තු මුදල් අය නොකිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.**Xxxxxxxxxxxxx**

**2020.05.20 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ තීරන හදිසි යෝජනා අංක- 09-01හි සත්‍ය උද්ධෘතයක් බවට සහතික කරමි.**

**එස්.එච්.ආර්.වීරක්කොඩි,**
**ලේකම්,**
**ප්‍රාදේශීය සභාව,**
**කුරුවිට.**

9-02. නිවාඩු අනුමත කිරීම

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

_ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රභාත් ජයසූරිය මහතා සහ_ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි ඩබ්. කේ. තිලකාවතී මිය හදිසියේ_අසනීප වි ඇති අතර නිවාඩු ලබා දිමට යෝජනා කරමි.හදිසි යෝජනා යටතේ ඉදිරිපත් කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

Xxxxxxxxxxxxxxx ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා විසින් ඉදිරිපත් කරන ලද හදිසි යෝජනා අනුව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රභාත් ජයසූරිය මහතා සහ_ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි ඩබ්. කේ. තිලකාවතී මිය හදිසියේ_අසනීප වි ඇති අතර නිවාඩු ලබා දිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx

වෙනත් කරුණු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ. විජේසිරි මහතා

මම වෙනත් කරුනු යටතේ රටේ ආර්ථික දේශපාලන ක්‍රියාදාමය තුල සිදුවූ කනගාටුදායක තත්වය පිලිබද අදහස් දැක්විමට අදහස් කරනවා.මුලින්ම කල යුත්තේ මේ ඇතිවි ඇති තත්වය පිලිබඳ ශෝකය පල කිරිමයි.

මේ සිද්ධිය තුල දේපල වාහන අලාභ උනා.අරගලය තුල. ගරු ධනංජය මන්ත්‍රි තුමාටත් යම් කරදර උනා.අපි සොයා බැලුවා. එක ගමේ .බොතේජු මන්ත්‍රි තුමා, පරනගම මන්ත්‍රි තුමිය, අනෙක් සහෝදර අය පිලිබඳ සොයා බැලුවා.

සභාවට උන හානිය වලක්වන්න මැදිහත් උන පොලිසියට ස්තුති කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා

මේ අරගලය තුල අපිට කනගාටුයි.දෙපිරිසක ගැටුමක්.ජිවිත වන්දිත් ගෙව්වා.අවසානයේ නව අගමැති වරයෙක් පත් කලා.ගරු ගෝඨාභය ජනාධිපතිතුමාට ස්තුති කල යුතුයි.රටේ තත්වයට හෙතු උනේ දරිද්‍රතාව, පීඩනය, ආර්ථික අවශ්‍යතා , . කාටත් පොදුයි.අද අපි තින්දු කලා .අපිටත් තේ ,කෑම එපා.තව මාස කීපයක් යාමට පෙර වෙනසක් වේවි. කොමසාරිස් පාලනයකට

යයි.කෙසේ වුවත් මේ රටේ දුගී දුප්පත් ජනතාවට යම් සෙතක් වෙනවානම් සහාය දිය යුතුයි.පීඩාවට පත් සියළු දෙනාට කනගාටුව පල කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා</u>

විජේසිරි මන්ත්‍රි තුමාට ස්තුතියි.මේ සිදුවූ දින 9 වෙනිදා.උදේ.මට දුරකතන මැසේජ් පනිවිඩයක් ආවා.ගරු අගමැතිතුමා තනතුරෙන් ඉවත් වෙනවා.දිරියක් දෙන්න එක්ව ඉන්න අරලියගහ මැදුරට එන්න කියලා.සභාපතිතුමත් එක්ක ගියා.පන්සිල් ගත්තා.ආපහු පංචිකාවත්තට ගිහින් විල්මට් එක්ක ආපහු ආවා.ත්‍රි රෝද රථයේ වැඩක්. දුරකරතන පනිවිඩයක් ආවා.ඇහැලියයගොඩ එජාප මන්ත්‍රි නමක් එක්ක උද්ගෝෂන කල තැනින් මගේ නම හොයාගෙන.ගැටළුවක්.අපි මුළු පවුලම ආරක්ෂිත තැනකට ගියා.එදා රෑ ඉඳලා පහට විතර ආවා.දේපල හානි වෙලා ඇති කියලා හිතුවා.

වටප්පිටිය කඩේ- ගම හදන තැන -උඩ තට්ටුවේ තමා ගමේ පිරිතක් කලත් ලැගුම් දෙන්නේ.ගමේ වැඩ වලට සහායක්.ඒකේ. වීදුරු කඩලා.ගෑස් සිලින්ඩර් ගෙනිහින්.පෝර තිබුනා ඒවා හලල. ගෙනිහින්.ලක්ෂ තුනක විතර හාන්යක්.ත්‍රි රෝද රථයත් කඩලා.රු. 30000 ක විතර මල් පෝච්චි හානි කරලා. දේශපාලනය නිසා විටෙක අධිකරනයට හිරේට යන්න උනා.බොරු චෝදනා වලට.ධර්මදාස කරඳන ගුරුපියා විදුහල්පති කාලේ මම සිසුවෙක් සමාජ සේවා කලා.වචන හුවමාරු උනා.ඒ ගැටළු.විජේසිරි මන්ත්‍රිතුමාගේ මවට මම සමෘර්ධිය මම ගෙදරට ගිහින් දෙන්නේ.මගේ මවගේ තෝසේ කඩේ බංකොලොත්.ඒක විනාශ කරලා.මම සමාජ සේවකයෙක්.දැන් මේ වනවිට කරුනු හෙලි වෙනවා.මේ වන විට මම කාටවත් වෛර කරන්නේ නෑ.ආගමික කටයුතු කරනවා. දේශපාලනයෙන් මම හම්බු කරගත් දෙයක් නෑ.නිරෝධායන වූ අයට ගම පුරා ගිහින් බඩු මළු දුන්නේ මගේ ත්‍රි රෝද රථයෙන්. නායකයා එන්න කීව ගමනයි ගියේ.නමුත් සාපෙල විභාගය කරන දරුවා ටත් මේ කරදර බල පානවා.දැන් නීතිය අනුව මම සියල්ල ක්‍රියාක කරනවා.සම්බන්ද අය ඉන්නවා නම් සියල්ලන්ටම මම නීතිය අනුව කටයුතු කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා</u>

සාමකාමි අරගලයක් තිබුනේ ගෝල්පේස් පිටියේ. මාත් දෙවතාවක් ගියා.නිර්පාක්ෂික නම් නෙවේ. අපි එදා මේක වෙන අතකට හැරෙන බව දැක්කා.එදා රූපවාහිනිය බැලුවාම අරලිය ගහ මැදුරට ගිය දා -හැසිරිම, බිමත්කම දැක්කා.විවිධ අන්වර්ත නාම යොදාගෙන ගම්වල නම් දාගෙන. මුහුනු පොතේ .ඉතා අශෝභන දේවල්.එසේම අනතුරු උනා.සමෘර්ධිය කපනවා කියලා ඇතැම් අය ගෙන්වාගෙන.හොඳටම ගහලා.නින්දිතයි.ගමේ අහිංසක මිනිහා ගුටිකෑවා.තිරිසන්වෙලා.එදා රත්නපුරේ ගිනිගත්තා හැබැයි මේ පාර එහෙම උනේ නෑ. මේ පැති දෙක වෙස්වෙලා ඒකයි.ගෙවල් ගිනි තියනවා. ඇත්තටම ජාතික සම්පත්.මංකොල්ල කාලා.ජේස්බුක් දාලා රත්නපුරේ එහෙම නොවුන එක ගැන.පිරිමි නැත්ද කියලා.වෛරයෙන් වෛරය සන්සිදෙන්නේ නෑ. මේ පුටු වෙනස් වෙයි.අපි සියළු දෙනා ජනතාවට සාධාරනය කරමු.අපි කෑති පොලු ගත්තේ නෑ.ඉදිරියේදි සාධාරනය කරමු. ජනතා දේ පොල විනාශ කරන්නේ නැතිව මේ වෙනස කල යුතුයි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>

මේ සිදු වුන දේ වැරදියි.නායකයා හමුවෙන්න අපි යන්න ඕනි.ජනාධිපතිතුමාට ජන්දය දුන්නා.තුනෙන් දෙකත් දුන්නා.ඉතින් නිසිලෙස රට කරන්න ඕනි.මම එදාත් කිවා.පෝර ගැටළුව ගැන.අර්බුධයක් වෙන බව.පාලනය කරන්න ඒ අය දැනගන්න ඕනි.ගරු අගමැතිතුමා ඉල්ලා අස් වුනානම් මේ ගැටළු නෑ.වියත් මගේ උපදෙස්. සම්පත් බෙතේජු මන්ත්‍රිතුමා පිලිබඳ

කනගාටුයි.අරගලය නිර්පාක්ෂික නෑ.විකසිත මන්ත්‍රිතුමා අනවුන්ස් කලේ.අපිටත් මතයක් තියෙනවා.ඒවා කරන්න ඕනි.තෙල් හාල් සියල්ල මිල වැඩියි. ඉදිරියේදී යම් තිරන ගන්න වෙනවා. තව දුරටත් අවුරුදු 30 ක දේශපාලනයේ රැඳෙනවද? විකල්පය කුමක්ද? මම 1971 පාසැල් ගියා.88-89 කාලේ ඒවටත් මුහුන දුන්නා.ඒකාලේ අපිත් හිටියා.ඒ දුන්න පත්‍රිකා ආදිය දැන් හොයාගන්න බෑ.තරුන කාලේ විප්ලව ලේ. මැරෙන්නැතිව බේරුනා. මේ අරගල

වෙනස්.ඒවා පටන් ගත්තෙම ගිනිතැබීම් වලින්.මේ අරගල නිර්පාක්ෂික නෑ.කෙසේ වුවත් රට ගොඩනගන්න අගමැති කම දිපු අය සමග සභාවෙන් කටයුතු කල යුතුයි.සභාවෙත් මූලා වැටිලා.වැඩිකරගන්න සභාවෙන් කටයුතු කරන්න.

රනිල් මහතා පෙර අගමැති කාලේ එරත්නටම ගහලා.මම චන්දි අරන් දුන්නා. සෙනරත් අප්පොගේ කාලේ ගැටළු කතා කරලා විසඳ ගත්තා. මොන ගැටළු ආවත් අපි බුද්ධියෙන් කටයුතු කරමු.රැකගෙන ආ එකමුතුව ඉදිරියට ගෙන යමු.හැමදේම බුද්ධියෙන් ගලපලා කරමු.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>

යම් යම් අදහස් දැක්වූවා.ඉතා ගරු කරනවා සභා ප්‍රදේශයේ තැන්පත්ව කටයුතු කලේ .මේ ප්‍රදේශ සාමකාමීව කටයුතු කලා.බුද්ධිමත්.අපි පාඩම් ඉගෙන ගත් අය.දේශපාලනය නිසා.මගේ දේශපාලන මතය වෙනස්.නමුත් සභාවෙන් කටයුතු කලා.මමඅවු. 35 න් පහල ජන්දේ ඉල්ලවේ.මේ දේශපාලනයේ අවසන් පුරුක මම.සමහරු වෛර උනා. මිත්‍ර උනා. අපි සාමකාමීව කටයුතු කල යුතුයි. නොහික්මුන හැසිරීම් නිසා අන්තිමට උසාවි යන්න ඉන්නේ ගෙදර පවුල විතරයි.කුපිත කරන අය පලාතේ නෑ.නාලන්ද එල්ලාවල ඝාතනයට හිටි අය අන්තිමට පක්ෂත් මාරු කරලා.අපි සංයමයෙන් වැඩ කරන්න ඕනි.තිබුන දේට වඩා පවතින දේ බැලිය යුතුයි.අපි එකිනෙකා දේශපාලන වෙනස් මත.නමුත් අපි සියළු දෙනා ජනතාවට සේවය කලා.ගරු සභාපතිතුමා බොහෝ ජනතා සේවා කලා.කුලරත්න මන්ත්‍රී තුමා, විජේසිරි මන්ත්‍රී තුමා ජනතා සේවය කලා. අපි වෙස් මත. නමුත් පිලිකුල්ලෙස පුද්ගලික මතවාද පටලාගෙන මඩ ගැහීම තරයේ හෙලා දකිනවා. මුහුනු පොතේ පහත්වැඩ. උද්ගෝෂන කරන්න අයිතිය තියෙනවා.දේපොල විනාශ කලොත් අපේ මුදල්මයි යන්නේ.කල යුතු දේ කල යුත්තේ නිතිගරුකව.අධිරාජ්‍ය වාදි අතකොළු නොවි ඉදිරි පරපුරට විනාශයක් නොවන්න එක්සත්ව ක්‍රියාමාර්ග ගමු.අපි පෙල ගැසෙමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීදීප්ති චන්දන මහතා</u>

9 දා උන සිදුවිම මේ විනාශයට මුල අරගලයට පහරදිම.මේ අරගලය වෙන අතකට යන්නේ.අපි රූපවාහිනියෙන් දැක්කා මුදල් බෙදාගන්න රන්ඩු වෙන හැටි. අපේ සදාචාරය බින්දුවට ගිහින්.

හැසිරීම පහත්.ඒනිසා එතනට ශිෂ්ඨ සම්පන්නව ලමයෙක් අරින්න බෑ.අරගල කරන්න ඕනි. මොකද පැට්‍රල් ඩිසල් මිල අධිකයි.ගැටළු අධිකයි. අපිටත් පතලයක් කරන්න බෑ.ඩීසල් නෑ.මටත් මේ තියෙන තත්වය මත ගෙදරින් පිටට යන්න දෙන්නේ නෑ. බිරිඳ දරුවෝ එපා කියනවා.ගෝනපිටියට සලකමුද කියලත් මුහුනු පොතේ තිබුනළු. මම දැක්කේ නෑ. මම ගන්නේ මේ සභාවෙන් ලබාදෙන දීමනාව පමනයි.අයුතු කිසිවක් නෑ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා අත්‍යවශ්‍ය කරුනක් සඳහා මහා සභාව දැනුවත්කර ප.ව.3.47 ට සභා ගර්භයෙන් නික්මින.**

මේ අවස්ථාව වන විට සභාවේ දැඩි ගෝෂා පැවතිනි.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-</u>

**මෙ සම්බන්ධව ඉතාමත් කනගාටුවට පත්වුනා.ෆේස්බුක් එකේ විවිධ ආකාරයේ මඩප්‍රහාර නිමක් නෑ. ඇත්තටම මම මේ තත්වයෙන් සිටීම පවා පුදුමයක්. අස්ථාන චෝදනා. මා ආගමන මේතාක් මට ඉතා සතුටුයි.ගරු චන්ද්‍රිකා ජනපතිතුමිය කාලේ වයින් ස්ටෝර්ස් සඳහා ලැබුන බලපත්‍රය අලෙවි කර මම ඉන්පසු ඒ මුදල් වලින් දිගු ගමනක් ආරම්භ කලා.මට හිටි තත්වය සමග සතුටුයි.**

**යුතුකමක් ලෙස අපි ගරු හිටපු අගමැතිතුමා සමුගැනීමේ අවස්ථාවට සහභාගී උනේ.නමුත් මේ වැනි කලබල සිතුවේ නෑ.මිනිස්සු අසරන වුනා පාර හොයාගන්නවත් දන්නේ නෑ.පාර පුරා සෙනග.අපි හිටියේ රැස්වීම් ශාලාවේ.මිනිස්සුන්ට ගැහුව එක වැරදියි. එහෙම නීතියක් කොහෙවත් නෑ.කෝටි ගානක සම්පත් විනාශ වුනා.මං ඉන්න තැනත් තහඩු දෙකක් කඩලා.මින්සුසු ආරංචියට 200 ක් විතර ඇවිත්. ආරක්ෂාවට .මම ගමේ කෙනෙක්.ඇත්තටම ජනතාව මං වෙනුවෙන් ආවත් මට බය හිතුනා.ඒ අයගේ ආරක්ෂාව ගැන.ෆේස්බුක් දාලා කොළඹින් එනකොට බෝධිමළුවෙදි ගහනවා කියලා. ගෙවල් ගිනි තියනවා.ඇත්තටම කනගාටුයි. මම හිතනවා මෙතන කව්රුත් මේවාට සම්බන්ධ නැතිව ඇති කියලා. අපි විවිධ මත දරනවා.ජේවිපී පිරිසක් ඇවිත් තියෙනවා වීඩියෝ වල තියෙනවා.නඩුවෙදි දෙනවා.කනගාටුයි. මට මේවා සභාවේ කීමට සිදුවිම ගැන.ප්‍රචන්ඩත්වය තිබුනේ.මම බෝධිමළුවටත් ගියා. හැමතැනම ගියා. මට මේවා ඉවරයක් තියෙන්න ඕනි.නොවිය යුතු දේවල්. කෙසේ වුවත් සභාවක් ලෙස අපි සහයෝගයෙන් කටයුතු කරමු.**

**මේ අවස්ථාව වන විට සභාවේ දැඩි ගෝෂා පැවතිනි.**

- **ස්තූතිය.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-</u>

අද දින මහා සභාව සඳහා සහභාගිවී සහය ලබාදුන් සියළු දෙනා හට ස්තූතිය පල කරමි. සභාවේ කටයුතු ප.ව. 4.00 ට ට පමණ අවසන් කරන ලදී.

ප්‍රේමරත්න මල්කැකුළ
සභාපති,
ප්‍රාදේශීය සභාව,
කුරුවිට.

පිටපත් : -

01.කුරුවිට ප්‍රාදේශීය සභාවේ සියලුම මන්ත්‍රීතුමන්ලා වෙතට - (දැ.ගැ.පි)
02.පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා - (දැ.ගැ.පි)
03.විගණකාධිපති,විගණකාධිපති උපකාර්යාලය,මහ නගර සභාව,රත්නපුර - (දැ.ගැ.පි)
04.ප්‍රධාන කාර්යාලයේ සියලුම වැඩසටහන් සහකාරවරුන්,සංවර්ධන නිළධාරීන්, කළමණාකාර සහකාරවරුන් හා කාර්මික නිලධාරීන් වෙතට - ඔබ විෂයට අදාල කටයුතු කිරීමට
05.කාර්ය භාර නිලධාරීන් - එල්ලාවල, කිරිඇල්ල, දොඩම්පේ - ඔබ කාර්යාලයට අදාල කරුණ ගැන අවධානය යොමු කිරීමට
06.ප්‍රජා සංවර්ධන නිලධාරී(දැ.ග.පි.)